# THE WHITE HACKLE

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

இலங்கை காலாட் படை சஞ்சிகை

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

www.slli.lk

71st ISSUE

2012 JANUARY




අප පමණක්ය අද ඔබ අප අතර නැත
එනමුත් ඔබේ උනුසුම මේ ගෙපැලේ ඇත
රට දැය සමය වෙනුවෙන් කැප කෙරුණු හිත
හින්දයි ලැබුනේ යුද ගින්නට නියම තිත





සෙන්පති නිරිඳ කළගුණ හදුනා ගැනුන
හිමි නැති නමුත් අපහට කෘත ගුණ දුන්න
යුද ගිනි රටෙන් පලවා හැර සෙත සැදුන
ජනපති තුමණී ඔබ ගැමුණුයි යළි උපන

# සුබ මොහොතින් නව තනතුරට පත් වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් !



6 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/64201 මේජර් එන්ඩබ්ලිව්ඩීජ්
නානායක්කාර ආර්එස්පී ශ්‍රීලපාහ



18(සේවා) ශ්‍රීලපාහ විධායක අධිකාරි
නි/6152 2/ලුතිතන්
ඩීඑම්එස් කුමාර ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ රෙජිමේන්තු
සැරයන් මේජර් සෙ/301470
බනි I ටීජී පුෂ්පකුමාර



රෙජිමූබ ශ්‍රීලපාහ රෙජිමේන්තු
සැරයන් මේජර් සෙ/302179
බනි I ඩබ්ලිව්එල්එන් කුළරත්න



1 ශ්‍රීලපාහ ඒකක
රෙජිමේන්තු සැරයන් මේජර්
සෙ/302990 බනි 11
සෝමසිරි අයිජීඑස්



8 ශ්‍රීලපාහ සරඹ උපදේශක
සෙ/316407 සැරයන් කුමාර ජීවී



16 (සේවා) ශ්‍රීලපාහ ඒකකයේ
උපකරණ පාලන සැරයන් මේජර්
සෙ/16ඩී00025 බනි II කන්නන්ගර එස්

# THE WHITE HACKLE

**71th Issue January 2012** www.slli.lk

Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry


# CONTENTS


| | PAGE |
|---|---|
| අදහස් උදහස් හා විවේචන | 02 |
| සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරවය දැක්වීම සඳහාය | 03 |
| රෙජිමේන්තු අධිපති තුමාගේ නව අවුරුදු පණිවුඩය | 04 |
| 11 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරී | 05 |
| සේවාවනිතා විත්ති | 06 - 07 |
| 23 සේමු 22 වන සංවත්සරය | 08 |
| යාපා පටුනේ නත්තල් අසිරිය | 09 |
| ඉගෙනුමට හපන් පාබල දියණියට සුබ පැතුම් | 10 |
| 20 ශ්‍රීලපාහ තෙවන සංවත්සරය | 12 |
| ක්‍රීඩා පුවත් | 14 - 15 |
| 15 ශ්‍රීලපාහ දිරිය ශක්ති සෙබළ නිවහන | 17 |
| 18 (සෙව්) ප්‍රජා සත්කාරයන් | 19 |
| කණ්ඩුල පුරාවත ග්‍රන්ථ යුගල එළි දැක්වේ | 20 - 21 |
| 8 ශ්‍රීලපාහ පස්වන අණදෙන නිලධාරී | 23 |
| 65 සේමු සැහැල්ලු පන්දු ක්‍රිකට් ශූරයෝ | 24 |
| 24 ශ්‍රීලපාහ පුවත් | 27 |
| 25 ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම් | 31 |
| විරුදරු ක්‍රීඩා උළෙල | 34 |
| ශ්‍රීලපාහ අන්තර් ඒකක මලල ක්‍රීඩා තරඟාවලිය | 35 |
| 19 ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම් | 36 - 37 |
| දසුනේ හසුන | 39 |
| ප්‍රහේලිකා අංක 50 | 39-40 |




10 රටේ අනාගතය ඔබයි පාබල දියණියනි අපේ



14 දෙස් විදෙස් ජය කෙහෙළි නැංවූ පාබල විරුවෝ



32 ජීවිතයක් ජීවත් කරන්නට පාබල විරුවන්ගෙන් ලේ පරිත්‍යාග




## කවරයේ කථාව

අපි වෙනුවෙන් අපි නිවාස ව්‍යාපෘතිය යටතේ කලුතර දිස්ත්‍රික්කයේ ඉදි කළ රණවිරු නිවාස 2011-12-24 වන දින රණවිරු අයිතියට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ උතුමානන්ගේ සුරතින් සිදු විය. එහිදී ශ්‍රීලපාහ රෙජිමේන්තුව හා රුදුරු ත්‍රස්තයන් සමඟින් සටන් කර වෙඩිතලතිව් ප්‍රදේශයේදී තුවාල ලබා අණතුරුව රෝහලේදී ගත කර සිටියදී 2010.04.11 දින මියගිය 11 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/320484 ලාකෝ සඳරුවන් කේජීආර් රණවිරුවාගේ ආදරණීය බිරිඳට නව නිවහනක අයිතිය පවරා දුන් අයුරු මෙසේ කවරයේ කථාවෙන් දිස්වේ.

කවරයේ කවි සංකල්පනාව
මේජර් ඒඩී ගුණරත්න ශ්‍රීලපාහ


Designed & Printed by
softWave
107D, Havelock Road, Colombo 05.
Tel : 011 2502295, 2502134, 2502135
www.softwave.lk

# THE WHITE HACKLE

SRI LANKA
LIGHT INFANTRY QUARTERLY

**Colonel of The Regiment**

**Maj Gen** RMD Rathnayake RWP RSP USP ndu psc

**Centre Commandant**

**Col** KJ Jayaweera RSP

## The White Hackle Editorial

**Editor in Chief**

Col KJ Jayaweera RSP

**Assistant Editors**

Maj KA Pushpakumara RSP psc SLLI
(ADJUTANT RHQ SLLI)

Maj HHPK Dayaratne SLLI
(Officer In Charge 'The White Hackle')

**Chief Consultant**

Maj Gen RMD Rathnayake RWP RSP USP ndu psc

**Honourary Consultants**

Maj Gen HV Athukorale VSV psc FBIM
(Rtd – Reg Force)

Brig AER Abeyesinghe KSV
(Rtd – Vol Force)

Publisher - Regimental Centre
Sri Lanka Light Infantry
Telephone - 0112855204
0112855356 - 60
Ext - 57656
Fax - 0112855204
E-mail - editor.whitehackle@gmail.com
editor.whitehackle@yahoo.com
Website - www.slli.lk


# Feedback

## අදහස්, උදහස් හා විවේචන
## Readers Please Write in

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 71th issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE', the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to 'THE WHITE HACKLE' We are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is " Ich Dien", " I Serve". Let 'White Hackle' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

-Editor-

## කතු වැකිය

හස්තියකු මංගල සංකේතය වශයෙන් නම් කොට පෝෂණය කරමින් සාඩම්බරයෙන් රැක බලා ගන්නා හමුදාවක් ලෝකයේ පවතිනම් දන්නා තරමින් ඒ අප පමණි.

ශ්‍රී ලංකා පාබල හමුදාවේ ඇතු මඟුල් සලකුණක් වන්නේ අප රෙජිමේන්තුවට හෝ යුද හමුදාවට පමණක් නොවේ, සමස්ත ශ්‍රී ලංකා වාසී ජනතාවටයි.

ශ්‍රී ලාංකීය වංශ කථාවේ විජයග්‍රාහී දුටු ගැමුණු රජතුමානන්ගේ අභීත හස්ති රාජයා වූ කණ්ඩුලගේ ප්‍රෞඪත්වය ශ්‍රී ලංකා පාබල හමුදාවේ නූතන කණ්ඩුල මඟුල් ඇතු ජීවමානව ප්‍රතිරූපනය කිරීම එයට හේතුවයි.

එවන් වූ ඓතිහාසික යුග මෙහෙවරක යෙදුනු අභීත හස්තියෙකුගේ රුවගුණ පුරා පනස් වසරක් සම්ප්‍රදායක් ලෙසින් ලාංකීය ජනතාවගේ නොමද ගෞරවාදරයටත් අභිමානයටත් පාත්‍ර වෙමින් දායක කරවීමද අප විසින් ඉටු කර ඇති තවත් සුවිශේෂී යුග මෙහෙවරකි.

කොළඹ කළා භවනේදී පවත්වන ලද "කණ්ඩුල හස්ති 50 වන සැමරුම්" උළෙල ඒ බැවි අප සියලු දෙනාට පසක් කර දුන් සුවිශේෂී අවස්ථාවක් වූ අතර, ශ්‍රී ලංකා පාබල හමුදාවේ විශිෂ්ටත්වය ලොවටම ප්‍රදර්ශනය වූ බැව් මෙහිලා මතක් කර දෙමි.


The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

## සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ට ගෞරව දැක්වීම සඳහාය

## IN HONOUR OF THOSE SLLI HEROES WHO MADE THE SUPREME SACRIFICE

**1983 වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුද කළ ශ්‍රීලපාහ විරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් ඔවුන්ගේ නාමලේඛනය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3351 | S/180770 | L/Cpl | Bandara WMDK | 10 SLLI | Iranamadu | 19/12/2008 |
| 3352 | S/315441 | Sgt | Rajapakshe RPCS | 10 SLLI | Iranamadu | 19/12/2008 |
| 3353 | S/319163 | Cpl | Samarakon SMNP | 8 SLLI | Kilinochchi | 20/12/2008 |
| 3354 | S/317542 | L/Cpl | Perera PASSK | 8 SLLI | Kilinochchi | 20/12/2008 |
| 3355 | S/321469 | L/Cpl | Iddamalgoda YGS | 8 SLLI | Kilinochchi | 20/12/2008 |
| 3356 | S/321688 | L/Cpl | Wijekumara BVS | 8 SLLI | Kilinochchi | 20/12/2008 |
| 3357 | S/314144 | Sgt | Dayananada RG | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3358 | S/43584 | L/Cpl | Ananda BMGC | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3359 | S/321115 | L/Cpl | Dayapala A | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3360 | S/321674 | L/Cpl | Aberathna MMIGSK | 8 SLLI | Kilinochchi | 20/12/2008 |
| 3361 | S/321947 | L/Cpl | Saman Kumara D | 8 SLLI | Kilinochchi | 20/12/2008 |
| 3362 | S/317276 | Sgt | Prasanna PLA | 8 SLLI | Kilinochchi | 20/12/2008 |
| 3363 | S/160676 | L/Cpl | Sadaruwan JAA | 8 SLLI | Kilinochchi | 20/12/2008 |
| 3364 | S/316063 | L/Cpl | Pushpakumara GP | 8 SLLI | Kilinochchi | 20/12/2008 |
| 3365 | O/65239 | Major | KGTL Telhelis SLLI | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3366 | S/43553 | L/Cpl | Aberathna RML | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3367 | O/65138 | Major | NPHLMK Narangoda SLLI | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3368 | S/316475 | Sgt | Ananda TGS | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3369 | S/315431 | Cpl | Priyantha Kumara WA | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3370 | S/318778 | Cpl | Prassanna DMCR | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3371 | S/319025 | Cpl | Rathnayaka RMCK | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3372 | S/321108 | L/Cpl | Jayathilaka WAA | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3373 | S/228579 | L/Cpl | Ranasinghe SVSH | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3374 | S/176623 | L/Cpl | Herath HMU | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3375 | S/321021 | L/Cpl | Samarakon SJM | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3376 | S/197569 | L/Cpl | Madusanka AVP | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3377 | S/197716 | L/Cpl | Senarath SKANK | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3378 | S/197709 | L/Cpl | Nandasiri PGS | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3379 | S/203961 | L/Cpl | Priyantha SG | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3380 | S/185929 | L/Cpl | Jagath S | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3381 | S/319570 | L/Cpl | Asanka ABT | 10 SLLI | Iranamadu | 20/12/2008 |
| 3382 | S/317359 | L/Cpl | Delgaha Kubura DLMLS | 10 SLLI | Gen:Hosp:ANP | 20/12/2008 |
| 3383 | S/315502 | L/Cpl | Wijerathna GGN | 10 SLLI | Iranamadu | 22/12/2008 |
| 3384 | S/306100 | L/Cpl | Perera WMK | 10 SLLI | Iranamadu | 22/12/2008 |
| 3385 | S/318785 | Sgt | Rathnayaka BMRS | 10 SLLI | Iranamadu | 22/12/2008 |
| 3386 | S/321939 | L/Cpl | Kumaratunga PA | 8 SLLI | Kilinochchi | 22/12/2008 |
| 3387 | S/43701 | L/Cpl | Sanjeewa Kumara HPI | 8 SLLI | Kilinochchi | 22/12/2008 |
| 3388 | S/43655 | L/Cpl | Gunasekara HMW | 8 SLLI | Kilinochchi | 22/12/2008 |
| 3389 | S/321936 | L/Cpl | Sanathsiri SP | 8 SLLI | Kilinochchi | 22/12/2008 |
| 3390 | S/321691 | L/Cpl | Jatalath JADRK | 8 SLLI | Kilinochchi | 22/12/2008 |
| 3391 | S/142080 | L/Cpl | Tilakasiri RDW | 8 SLLI | Kilinochchi | 22/12/2008 |
| 3392 | S/318153 | Cpl | Pushpakumara TGW | 8 SLLI | Kilinochchi | 22/12/2008 |
| 3393 | S/156415 | L/Cpl | Hettiarachchi HANC | 8 SLLI | Kilinochchi | 22/12/2008 |
| 3394 | S/43550 | L/Cpl | Ariyarathna RPRK | 8 SLLI | Kilinochchi | 22/12/2008 |
| 3395 | S/320268 | L/Cpl | Tissa Kumara WM | 15 SLLI | Mullayaweli | 22/12/2008 |
| 3396 | S/203962 | L/Cpl | Indika Prasad HWM | 10 SLLI | Iranamadu | 22/12/2008 |
| 3397 | S/318209 | Cpl | Sepala KG | 7 SLLI | Akkarayan Kulam | 22/12/2008 |
| 3398 | S/319631 | Cpl | Dasanayaka SM | 11 SLLI | Kilinochchi | 23/12/2008 |
| 3399 | S/310530 | L/Cpl | Amarakirthi Banda Am | 19 SLLI | Olumadu | 24/12/2008 |
| 3400 | S/317109 | L/Cpl | Sumanasiri JMJ | 10 SLLI | Gen:Hosp:CBO | 25/12/2008 |

තව කොටසක් ලබන කලාපයේ

# රෙජිමේන්තු අධිපති

## මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් නිකුත් කරනු ලබන 2012 වර්ෂයේ අලුත් අවුරුදු පණිවුඩය

වර්ෂ 2012 ක් වූ නව වසර උදාවන මෙම මොහොතේදී ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති වශයෙන් සුබාශිංසන පණිවුඩයක් නිකුත් කරනුයේ ඉමහත් අභිමානයෙනි.

නිත්‍ය බළඇණි 17ක්ද ස්වෙච්ඡා බළඇණි 09 ක් ඇතුලුව රෙජිමේන්තු මුලස්ථාන බළඇණියකින් හෙබි අප රෙජිමේන්තුව වසර 130 කට වඩා පැරණි ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන්නකි. රට තුළ පැවති ත්‍රස්තවාදි ක්‍රියා සමථයකට පත්කර සාමකාමී වාතාවරණයක් දක්වා අවතීර්ණ වීම තෙක් සිදු වූ සෑම ක්‍රියාකාරකමකදීම අප රෙජිමේන්තුවට අයත් නිලධාරින් හා සෙසුනිලයන් ඇපකැපවී රාජකාරි කර ඇති බව ඔබ අප කවුරුත් දන්නා කරුණකි. රෙජිමේන්තුවක් වශයෙන් අප මේ වන විට රටේ සංවර්ධන ක්‍රියාවලියට පන්නරයක් ලබා දෙමින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත්කිරීමේ ජාතික සැලැස්ම සඳහා ශ්‍රම පරිත්‍යාගයෙන් දායකව සිටී. ලොව දරුණුතම යැයි සැලකුන ත්‍රස්තවාදි සංවිධානයක් විනාශ කිරීමට හැකි වූ අප අද රටෙහි ක්‍රියාත්මක ජාතික සැලැස්ම මුදුන් පත් කරවීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති හෙයින් ඒ සඳහා ජාතික අභිමානයෙන් යුතුව පෙළ සැදීමට මෙම නව වසර තුළදී ද අදිටන් කර ගත යුතුය.

ගෙවීගිය කාල වකවානුව තුළ අප සමග උරෙන් උර ගැටී සේවය කර දේශය වෙනුවෙන් දිවි පුදා ප්‍රාණදානයෙන් තම වගකීම ඉටු කළ රණවිරුවන් 3807 දෙනෙකු හට කෘතගුණ සැළකීම වෙනුවෙන් ඔවුන්ගේ ඥාතීන් වෙත ඔවුන් සිටින පළාත් වලට ගොස් "උදාරයි ඔබ" සංකල්පය යටතේ උපහාර පුද කිරීමට හැකිවූ බව මා මෙම අවස්ථාවේ සිහිපත් කරමි. තවද එම රණවිරුවන් සදා අනුස්මරණය කිරීම සඳහා ශ්‍රී ලංකා පාබල හමුදා කඳවුරු පරිශ්‍රය තුළ දැවැන්ත රණවිරු ස්මාරකයක් ඉදිකිරීම ආරම්භ කර ඇත. එහි මේ වන විටත් මූලික වැඩ කටයුතු ඔබ සැමගේ සහය ඇතිව සිදු කරමින් පවතින බව සිහිපත් කරනුයේ මහත් වූ අභිමානයෙනි. තවද අප රෙජිමේන්තු මංගල හස්ථියා වන කණ්ඩුල සංකල්පයට වසර 50 ක් සපිරීම නිමිති කොට පසුගිය වසර තුළ එය සැමරීමටත් කණ්ඩුල හස්ථියාට කෘතගුණ සැලකිමටත් ඔබ සැමගේ සහයෝගය අනුව හැකිවූ බව ප්‍රකාශකර සිටිමි.

ශ්‍රී ලංකා පාබල හමුදා සමාජිකයින් වන ඔබ සැම විටම ඔබ වෙත පැවරී ඇති වගකිම හා කාර්ය භාරය මනාලෙස අවබෝධ කරගෙන ඒය අප සැම විසින් අපගේ මාතෘභූමියත්, එහි වෙසෙන ජනතාවත්, වෙනුවෙන් ඉටු කළ යුතු පරම යුතු කමක් සේ සලකා ඉටු කිරීමට වගබලා ගත යුතුය. තම කාර්යය ඉටු කිරිමේදී පාබල හමුදා සෙබළුන් වශයෙන් අන් අයහට ආදර්ශයක් වන පරිදි රාජකාරීන් උසස් අන්දමින් ඉටු කිරීමට උදාවන නව වර්ෂයේදී ද අධිෂ්ඨාන කරගත යුතු අතර, ක්‍රීඩා කුසලතා සහ අනකුත් ක්‍රියාදාමයන් තුළින් යුද හමුදා ඉතිහාසයට මුලාශ්‍ර එක් කළ අප රෙජිමේන්තුව ඉදිරි වසර තුළදී ද සියලුම ක්‍රීඩා අංශයන් ජයග්‍රහණය කර එම තත්ත්වය ඉදිරියට පවත්වා ගත යුතු බව සිහිපත් කරමි. අප ක්‍රීඩාමය වශයෙන් පසුගිය වසර තුළ කැපී පෙනෙන උසස් දක්ෂතා දක්වා ඇති බැවින්, ඉදිරියේදී එම ක්‍රීඩා කුසලතා වැඩි දියුණු කරගැනීම සදහා ඔබ සැවොම අදිටන් කරගත යුතුය.

ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා ඒකිය භාවය සුරකීම උදෙසා රුදුරු ත්‍රස්තවාදීන් සමඟ දශක තුනකට වැඩි කාල සීමාවක් නොබියව තම ජීවිතය පරදුවට තබා සටන් කළ සියලුම නිලධාරින් සහ සෙසුනිලයන් හට මේ මොහොතේදි මාගේ කෘතඥතාව පුද කරමි. යුදමය වාතාවරණය තුළදි ත්‍රස්තවාදී ප්‍රහාරයන් හේතුවෙන් අප අතරින් වියෝ වූ සියලුම රණවිරුවන් ඉතා ගෞරවයෙන් සිහිපත් කරන අතර ආබාධිත තත්ත්වයට පත්වූ සියලුම රණවිරුවන් හට ඉක්මන් සුවය ලැබේවායි මා නිරතුරුව ප්‍රර්ථනා කරමි. රට දැය වෙනුවෙන් මේවැනි උදාරතර මෙහෙයක් ඉටු කිරීම උදෙසා ඔවුන් බිහි කළ දෙමවුපියන්ටත් ඔවුන්ගේ අඹුදරුවන් සහ සියලුම ඥාති මිත්‍රාදින්ටත් කෘතඥතාවය පුද කිරීමට මා මෙය අවස්ථාවක් කරගනිමි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ සියලුම නිලධාරින් සහ සෙසුනිලයින් ඇතුලු පවුල්වල සියලු සාමාජිකයින්ටත් සිවිල් සේවක මහතුන් ඇතුලුව එම පවුල්වල සියලුම සාමාජිකයන්ටත් ලැබුවා වූ මෙම නව වසර යස ඉසුරින් සපිරි සෞභාග්‍යමත් නව වසරක් වේවායි ප්‍රර්ථනා කරන අතර, තුවාල ලබා දැනට රෝහල් ගතව ප්‍රතිකාර ලබන සියලුම සමාජිකයන් හට ඉක්මන් සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරමි. ඕනෑම භාරදූර කාර්යයක් ඉටු කිරීමට ඔබ සැමට තෙරුවන් සරණ හා සියලු දෙවියන්ගේ ආරක්ෂාව ලැබේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

''ඔබ සැමට තෙරුවන් සරණයි ''

ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී
මේජර් ජෙනරාල්
රෙජිමේන්තු අධිපති ශ්‍රී ලංකා පාබල හමුදාව

2012 ජනවාරි මස 01 දින

# 11 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරී රාජකාරී වැඩ අරඹයි

එකොළොස්වන වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ සිව්වන අණදෙන නිලධාරි වශයෙන් පත්වූ නි/62252 මේජර් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ 2011 නොවැම්බර් මස 18 වන දින සුබ මොහොතින් තම තනතුරේ වැඩ අරඹන ලදී.



මාවඩ්ඩි යුද හමුදා කඳවුරු භූමියේදී පිළිගන්වන ලද සම්මාන මුරය පිළිගැනීමෙන් අනතුරුව නව අණදෙන නිලධාරි එදින 0847 පැයට යෙදුන සුබ මොහොතින් මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මැද නව අණදෙන නිලධාරි තනතුරේ වැඩ භාරගැනිම සිදු කරන ලදී. නව අණදෙන නිලධාරි විසින් එදින රැස්ව සිටි භටපිරිස් ඇමතීමේදී වන්නි



මානුෂිය මෙහෙයුමේදී ඒකකය දැක්වූ දක්ෂතාවයන් පිළිබඳව තමා බෙහෙවින් සතුටුවන බව ද ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මහත් දුෂ්කරතා මධ්‍යයේ ජීවිත පරිත්‍යාගයෙන් උපන් බිම රැක ගැනිම සඳහා රාජකාරී ඉටු කොට අපගෙන් වියෝවූ පාබල නිලධාරි හා සෙසුනිලයින් ඉතා ගෞරවයෙන් සිහිපත් කරන ලදී. ඒකකය සමගින් රාජකාරී කරමින් සිටියදි තුවාල ලැබූ සහ පූර්ණ ආබාධිත තත්ත්වයේ පසුවන සියලුම නිලධාරි/සෙසුනිලයින් ඉතාම ගෞරවයෙන් යුතුව සිහිපත් කිරීමටද අමතක නොකළහ. ඒකකයේ දැනට රාජකාරී කරනු ලබන සියලුම නිලධාරි සහ සෙසුනිලයින් හට තම පුද්ගලික ජීවිතය හා යුද හමුදා ජීවිතය යන අංශ දෙක මනා සමබරතාවකින් යුතුව පවත්වාගෙන යාම ඉතාමත් අත්‍යාවශ්‍ය බව සියලු දෙනාගේ අවධානයට යොමුකරන ලදී. අවසන් වශයෙන් ඒකකයේ උන්නතිය වෙනුවෙන් තම උපරිම දායකත්වය ලබාදිමට තමන් සියලුම නිලයින්ගේ සහයෝගය බලාපොරොත්තු වන බවද සඳහන් කරන ලදී.

නව අණදෙන නිලධාරි තුමාගේ සියලු කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි බලඇණියේ සියලුම නිලධාරි සහ සෙසුනිලයින්ගේ ප්‍රාර්ථනාව වන අතර, 11 වන බලඇණිය සාර්ථකත්වයේ හිනිපෙත්තටම ගෙන යාමට අවශ්‍ය ධෛර්යය හා ශක්තිය එතුමාට ලැබේවායි එක සිතින් අප සියලු දෙනාම ප්‍රාර්ථනා කරමු.

11 ශ්‍රීලපාහ බුද්ධි අංශය

# HUNGER

**Thou insatiable ravenous vulture!**
**Torturer of both man and animal,**
**Cross not my door step thou villain!**
**Endowed with vicious talons withal,**
**Lay not the grip on me or mine,**
**Be gone thou monster.**

Jayaweera D Gunarathna
Father-in-Law of
Pte Perera BL - 4 SLLI

## මතකයේ සඳ ළඟ

**දුර කතරක ඔබ ගෙවනා**
**කටුක ජීවිතය මම දනිමි ...**
**ගිනි අවිය අතට ගෙන**
**ගෙවනා තත්පරයක් පාසා ...**
**ඔබ මා ගැන සිතනා**
**බව මා දන්නෙමි ...**
**දින සති මාස ගණන්**
**මා එනතුර ඔබ පෙරුම් පුරන...**
**බව කෙතරම්ද යැයි**
**මම දන්නෑ රත්තරන් ...**

සාසෙ සෙනෙවිරත්න බීඩීඑස්ඩී
ඩි කණ්ඩායම 19 ශ්‍රීලපාහ

සේවා වනිතා විත්ති

# රණවිරු සුබසාධනය





සෑම වර්ෂයක් පාසාම රණවිරුවන්ගේ අධ්‍යාපනය ලබන දූදරුවන්ගේ අධ්‍යාපන කටයුතු දිරි ගැන්වීම සඳහා ශිෂ්‍යාධාර මුදල් ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනිය හා සෙසු සාමාජිකාවන් අතින් පිරිනමන ලදී.



පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ක්‍රියාකාරී සාමාජිකාවක් වූ රෝෂි ඈන් ගමගේ මහත්මියගේ හිතවත් රට ජාතියට හිතැති දානපතියෙකු විසින් යුද්ධයේදී ආබාධිත තත්ත්වයට පත්වූ සෙ/311420 සැරයන් දමින්ද එම්එච් යන රණවිරුවා වෙත කෘතිම පාදයක් 2011.11.03 වන දින පිරිනමන ලදී.

යුද්ධයෙන් ආබාධිත රණවිරුවන් ගේ නිවාස ගැටළු විසදා දීමේ අරමුණින් ඉඩම් හා නිවාස නොමැති රණවිරුවන් සඳහා ඉඩම් මිළදී ගැනිමට රෙජිමේන්තු අධිපති තුමන් විසින් ප්‍රේෂණපත් පිරිනමන ලදී.



ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනියගේ උපදෙස් මත යුද්ධයේදී ආබාධිත තත්ත්වයට පත්වූ රෙජිමූබ ශ්‍රීලපාහට අයත් සෙ/317077 කෝප්‍රල් රණසිංහ ඩබ්ලිව්එම්ජී රණවිරුවාගේ දියණියට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනිම සඳහා රුපියල් 130,000.00 ක මුදලක් රෙම ශ්‍රීලපාහ සේනාවිධායක තුමාගේ සුරතින් 2012.01.12 වන දින පරිත්‍යාග කරන ලදී.







වසර ගනනාවක සිට ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙත ආධාර උපකාර කල සුජාතා අත්තනායක මහත්මිය හා නෑහිතවතුන් විසින් යුද්ධයෙදි ආබාධිත තත්ත්වයන්ට පත්ව ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දැනට ඇතුලත් කර සිටින ආබාධිත රණවිරුවන් විශාල පිරිසකට 2011.12.29 වන දින කෘතිම පාද පරිත්‍යාග කරන ලදී.







# WAR HERO SOLDIER'S DREAM HOME TURNS A REALITY ON HIS DAUGHTER'S BIRTH DAY

Seva Vanitha Branch of the Sri Lanka Light Infantry (SLLI) handed over another newly built house at Poojapitiya, Kandy to a differently able SLLI War Hero on 22 January 2012; captivating on the very same day on which his daughter's first birth anniversary fell.







The War Hero, S/314767 Corporal Anura Bandara PM who lost his sight in both eyes due to an LTTE terrorists' explosives blast in the year 2008 during a military operation at Madu, Mannar had informed of his dream for a new home to Hon. President Seva Vanitha SLLI Branch earlier, as he realized that his family encumbrances and physical injuries hampered his wish. Nevertheless, the prompt decision by Seva Vanitha SLLI Branch to attend the war hero's ambition soon gathered momentum as work teams of the Headquarter battalion SLLI was ready to give their hand with physical labour to the construction work.





The total construction work was completed within few months and the house with modern amenities including electricity and pipe-born water was ready to occupy. On completion of the work, the Regimental Centre SLLI under Centre Commandant Colonel KJ Jayaweera RSP on direction of Colonel of the Regiment planned the house warming ceremony to coincide with the first birthday anniversary of the differently able war hero's daughter.

Mrs. Damayanthi Ratnayake, the Hon. President Seva Vanitha Branch of the SLLI and Major General RMD Ratnayake RWP RSP USP ndu psc, the Chief of Staff Sri Lanka Army and Colonel of the Regiment SLLI attended the occasion as Chief Guests. This time too, the total construction cost for the new house was met by the Seva Vanitha SLLI Branch. The Seva Vanitha ladies built the new house to the War Hero on a piece of beautiful land in the countryside offered by Dr. Asanka, a philanthropist in the Kandy area.

The Chief Guests who arrived there in the morning planted a few mango saplings in the garden of the new house to mark the occasion. Soon after, the house warming ceremony began. Major General RMD Ratnayake beside Mrs. Damayanthi Ratnayake and war Hero family members unveiled the special plaque erected there and opened the door of the newly built house at the auspicious time. Thereafter, the gathering entered into the new house amidst pirith chanting by Venerable Maha Sangha who attended the occasion.

While addressing the gathering Major General RMD Ratnayake RWP RSP USP ndu psc commended all who contributed to the benevolent effort. In addition, a few specially designed plaques were also presented to those who helped to build the house as a token of gratitude.

**Courtesy: www.slli.lk**





# 23 වන පාබල සේනාංකය 22 වන සංවත්සරය අභිමානයෙන් යුතුව සැමරූ වගයි



23 වන පාබල සේනාංකයේ 22 වන සංවත්සරය 2012.01.01 වන දින පූනානි සේනාංක මුලස්ථානයේදි නිලධාරි හා සෙසුනිලයින් සියලු දෙනා එක්ව මහත් අභිමානයෙන් යුතුව සමරණ ලදී. එදා මෙදාතුර සේනාංකයට නායකත්වය







ලබා දුන් සෙන්පතින් 23 දෙනකුගේ අණදිම යටතේ මහත් කැපවීමකින් හා දැඩි අධිෂ්ඨානයකින් යුතුව කටයුතු කර ඇති මෙම පාබල සේනාංකය වර්තමාන සේනාංකාධිපති බ්‍රිගේඩියර් මහින්ද මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පීගේ අණදිම යටතේ මඩකලපුව, පොලොන්නරුව සහ අම්පාර දිස්ත්‍රික්ක ආවරණය කරමින් ඒ යටතේ 231, 232 හා 233 බළසේනා මූලස්ථාන තුන හා ඒකක නවයක් ස්ථානගතව රාජකාරි ඉටු කරනු ලබයි.

දශක තුනකට ආසන්න කාලයක් අපගේ මව්බිම වෙලාගෙන සිටි රුදුරු ත්‍රස්තවාදය පරදවා සාමයේ අරුනළු පිබිදෙන මෙවන් මොහොතක 22 වන සංවත්සර දිනය ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් උත්සවශ්‍රියෙන් සැමරීමට ලැබීම මහත් වූ භාග්‍යයකි. යුද බිමේ දිවිපිදු හා අතුරුදහන් වු රණවිරුවන් හට පිං පැමිනවීමටත්, ආබාධිත රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමටත්, රාජකාරියේ නියුතු සියලුම නිලධාරින් හා සෙබළුන් හටත්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, සිවිල් සේවක මහතුන්ටත් සෙත්පතා 2012.01.01 වන දින සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයක් පවත්වා පසු දින ස්වාමින් වහන්සේලා 22 දෙනමක් සඳහා හීල් දානය ද පිරිනමන ලදී.

සේනාංකයේ අභිමානය විදහාපාමින් සේනාංක දිනය නිමිතිකොට ගෙන සම්ප්‍රදායානුකූලව සේනාංකාධිපති වෙත අභිමානවත් ලෙස සම්මාන මුරයක් හා සම්මාන පෙළපාළියක් පිරිනමා ගෞරව දක්වීමට සේනාංකයේ නිලධාරින් ඇතුළු සෙසුනිලයින් කටයුතු කළහ. ඉන් අනතුරුව 23 සේනාංකාධිපති තුමා විසින් සේනාංක මුලස්ථානයේ දී අඹ පැළයක් රෝපනය කිරීමෙන් පසු සියලු නිලයන් එක් වූ දිවා භෝජන සංග්‍රහයකටද සහභාගි විය. පසුදින එනම් 2012.01.02 වන දින සේනාංකාධිපතිතුමන් විසින් සේනාංක මුලස්ථානයේ හා ඒ යටතේ පාලනය වන බළසේනා/ඒකකයන්හි 2000 ට ආසන්න හටපිරිසක් අමතමින් විනයගරුකව සහ ධෛර්යමත්ව, අවංකව තම කාර්යයන් ඉටුකරන ලෙසත් පැවසීය. රටේ ඉදිරි සංවර්ධන ක්‍රියාවලිය සඳහා කැපවෙමින් තම දායකත්වය ලබාදි මෙම ප්‍රදේශයේ ජිවත්වන සියලුම ජනතාවගේ සිත්සතන් දිනාගෙන නැවත විනාශකාරී යුද්ධයක් ඇති නොවන ලෙස වගකිමකින් යුතුව තම රාජකාරිය ඉටුකරන ලෙසත්, වැඩි දුරටත් පැවසීය.

සංවත්සරයට සමගාමීව මෙම සේනාංකයේ රාජකාරි නියුතු සියලු නිලයින් හා සිවිල් සේවක මහතුන්ගේ එකමුතුකම හා සුහදශිලිත්වය ගොඩනැංවිම සඳහා එදින රාත්‍රියේ යුද හමුදා අධිරිද්ම සංගිත කණ්ඩායමේ දායකත්වයෙන් සංගිත ප්‍රසංගයක් ද පැවැත්විණි.

වසර 22 ක් පුරා යුද්ධයෙන් පිඩිතව දුක් කම්කටොළු රැසක් මධ්‍යයේ සියලු බාධක ජයගෙන මේ දක්වා ආ ගමන ආශිර්වාදයක් කර ගනිමින් මෙම සේනාංකයේ ඉදිරි ගමනද සාර්ථක කර ගැනිම සඳහා ඇවැසි ශක්තිය හා ධෛර්යය සේනාංකාධිපති ඇතුලු සියලුම නිලයන් හට ලැබේවායි යන්න අප සැමගේ ඒකායන ප්‍රාර්ථනයයි.

**ලුතිතන් කර්නල් එම්එච්එම්එල්එස්කේ වීරසේකර ශ්‍රිලපාහ**
**සිවිල් සම්බන්ධිකරණ නිලධාරි 23 සේමු**





# යාපා පටුනේ නත්තල්

# අසිරිය සැමරීමට 11ශ්‍රීලපාහ එක්වේ






වර්ෂ 2011 නත්තල් උත්සව සැමැරුම් අතර යාපනය නත්තල් උත්සවය මෙවර සුවිශේෂී විය. උතුරු නැගෙනහිර ප්‍රදේශයේ යුදමය වතාවරණය පැවති නිසා යාපනය ප්‍රදේශයේ ජනතාවට පෙර වර්ෂ වලදී නත්තල් අසිරිය සැමරීමට නොලැබින. එහෙත් යුද්ධය අවසාන වීමත් සමගම යුද හමුදාව යාපනය ජනතාව සමග විවිධ උත්සව කටයුතු සංවිධානය කිරීමට මූලික වී ඇත. යාපනය ආඥාපති තුමාගේ සංකල්පයක් මත 51 සේනාංකාධිපති තුමාගේ හා 513 බසේමු බළසේනාධිපති තුමාගේ මග පෙන්වීම මත 11 වන ශ්‍රීලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි මේජර් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ යාපනය ප්‍රදේශයේ පිහිටි ඒකකයන් හි අණදෙන නිලධාරි වරුන් ඇතුලු සියලුම නිලධාරි හා සෙසුනිලයින්ගේ පූර්ණ මෙහෙය වීම මත යාපනය ශාන්ත මරියා දේවස්ථානයේ දි 2011.12.28 වන දින නත්තලේ අසිරිය යුද්ධයෙන් පීඩා විදි සිවිල් ජනයා සමගින් සමරන ලදී. මෙහි ප්‍රධාන අරාධිත අමුත්තන් වශයෙන් යාපනය ආරක්ෂක සේනා මුලස්ථානයේ ආඥාපති තුමා, යාපනය දිසාපති තුමිය හා යාපනය ප්‍රදේශයේ රදගුරු තෝමස් සෞන්දර්නායාගම් පියතුමාද විය. තවද නත්තල් කැරොල් ගී උත්සවයක් පැවැත්වීම මෙහි තවත් විශේෂාංග යක් විය. යාපනය ප්‍රදේශයේ පිහිටි දේවස්ථානයන් හි නත්තල් කැරොල් ගී කණ්ඩායම් එදින සන්ධ්‍යාව ගීතිකා වලින් වර්ණවත් කරන ලදී. තවද, ගවලෙන නිර්මාණය කිරීමට 11 ශ්‍රිලපාහ ඒකකයේ පූර්ණ දායකත්වය ලබාදෙන ලදී. එදිනට පැමිණි සියලුම කුඩා දරුවන් හට නත්තල් ත්‍යාග ලබා දි කුරිරු යුද්ධයෙන් පිඩා විදිමින් සිටි කුඩා දරුවන්ගේ මානසික චිත්ත ධෛර්ය ඉහල නංවාලිමේ අරමුණෙන් යුද හමුදාව විසින් සිදු කරන ලද තවත් මහගු ක්‍රියාවක් ලෙස මෙය පෙන්වා දෙමි.

11 ශ්‍රිලපාහ බුද්ධි අංශය

## යළිත් නොඑනා පාසැල් කාලය

හුදකලා වූ ජීවයට
තවද කඩ ඉම් අත ඉතිරි බව
මතක් කර දුන් නුඹ මවකි මට
නුඹෙන් ඈතට වෙන්ව යන විට
හඬා වැළපේද ... ?
ඇකඩමිය නුඹ...

**2 ලුතිතන් ඩබ්එම්එන් වීරසේකර ශ්‍රීලපාහ**
**18 (සෙව්) ශ්‍රීලපාහ**

## දයාබර සොඳුර

කටුක දිවියෙන් මා මුදන්නට
එදා ඔබ තැබූ පියවර මිණි පහනක්ය...
ගිනි අවිය අතදරා යුද බිමට
ගියමුත් එදා රුධිර දහදිය හෙළුවත්
මා මටද අවිශ්වාසය...
එවන් සිතට අනේක වරක්
එඩිතර භාවය ඇති කළේ ඔබයි...
ගිනිගෙන දැවෙන යුද බිමක
නිමාව සනිටුහන් වූයේ
රට තුළ සේසත් ලෙළවමින්ය
අඳුරේ වූ මගේ සිතට
ආලෝකයක් වූ ඔබ
කිසිදා තනි නොකරමි
මා දයාබර සොඳුරියේ

ලාකෝ රත්නායක ආර්එම්සි
බි කණ්ඩායම 19 ශ්‍රීලපාහ

## නැගුණ සදක්

**නැගුණ සදක්**
**සද මල්ලක දසුන්**
**ඔබේ මැවෙනවා**
**පිපුණු මලක**
**මල් පෙත්තක සුවද**
**ඔබේ මැවෙනවා**
**මතක පොතක**
**පිටු මතක අපේ**
**සිතේ ඇදෙනවා**
**සිතේ දුකට**
**දුක හිතුනාම තනියම**
**මට ඇඬෙනවා**

සාසෙ සම්පත් කුමාර ඒඑම්බී
බී කණ්ඩායම 24 ශ්‍රිලපාහ

# ඉගෙනුමට හපන් පාබල දියණියට සුබ පැතුම්

දෙදහස් එකොළහ පස්වන වසර ශිෂ්‍යත්ව විභාග යෙන් විශිෂ්ට ලෙස සමත් වූ පාබල දියණියකට පසු ගියදා පාබල හමුදා සුබාංශිංසන සහ අතහිත පිරි නැමුණි.

එසේ සුබ පැතුම් ලැබූයේ 14(සෙව්) පාබල හමුදාවේ සෙ/14ඩී00063 කෝප්‍රල් ධර්මදාස ආර්එම්ජේ ගේ දියණිය වන අතර, ඇය ලකුණු 175ක් ලබා ඉතා විශිෂ්ට ලෙස 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වී ඇති බැව් ඇසූ 14(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරිඇතුලු සියලුම දෙනා විසින් එම දියණියට අලිමංකඩ චුන්ඩිකුළම් කඳවුරේදී සුබාශිංසන පිරි නැමිණි.



රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ රත්මලවින්න ගමේ පාසැලින් සිප් සතර හදැරූ මෙසේ විශිෂ්ට සමත්කම් දක්වූ ආර්එම් නවෝද්‍යා ධනංජනී ජයලත් දියණියට ඒකක අණදෙන නිලධාරි මේජර් ඩීසීකේඩබ්ලිව් රණසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ ඇතුලු සියලුම නිලධාරීන් හා සෙසුනිලයින් ගේ කැමැත්තෙන් එකතු කරන ලද රුපියල් 10,000.00ක මුදලක් සහ රුපියල් 3,000.00 ක් වටිනා අධ්‍යාපනික පතපොත ප්‍රදානය කරන ලදී.



සිය දියණියන් දෙදනා සහ බිරිඳ සමඟින් කඳවුරට පැමිණී කෝප්‍රල් ධර්මදාස වෙත ඒකකයේ සියලු දෙනා විසින් තේ පැන් සංග්‍රහයක් ද සංවිධානය කර තිබිණි.

**සෙ/14ඩී00999 ලාකෝ ගුණවර්ධන ඩීසීසී**
**බළඇණි කාර්යාලය 14(සෙව්) ශ්‍රීලපාහ**

# ශ්‍රී සෝමස්කන්ද විද්‍යාලයේ අ:පො:ස: (සාපෙළ) විභාගය සඳහා පෙනී සිටින දූ දරුවන් හට ගණිත හා විද්‍යා සම්මන්ත්‍රණයක්

5 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ස්ථානගත යාපනය අච්චුවේලි ප්‍රදේශයේ පිහිටි ශ්‍රී සෝමස්කන්ද විද්‍යාලයේදී 2011.11.19 වන දින මෙම ඒකකයේ දායකත්වයෙන් 2011 වසරේ අපොස (සාපෙළ) විභාගය සඳහා පෙනී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් 364 දෙනෙකු හට ගණිතය හා විද්‍යා සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.



මෙම සත්කාර්යය සාර්ථක කිරීම සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය ආඥාපති(යාපනය) මේජර් ජෙනරාල් එම් හතුරුසිංහ ආර්එස්පී එන්ඩීසී අයිජී, 51 සේනාංකාධිපති බ්‍රිග්‍රේඩියර් ඒපී ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්පී පීඑස්සී හා 511 බළසේනාධිපති ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී සහ මෙම ඒකක අණදෙන නිලධාරි මේජර් ජීඒඑල් කිත්සිරි ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ සෘජු අධීක්‍ෂණය යටතේ සිදුකරන ලදී.

**බුද්ධි අංශය 5 (සෙව්) ශ්‍රීලපාහ**







# නැගෙනහිර සංවර්ධනයට කෘෂිකර්ම හා වෙළඳ ප්‍රදර්ශණයක්



දශක තුනකට අධික කාලයක් තිසිසේ පැවැති දරුණු යුද්ධයෙන් අනතුරුව සීඝ්‍රයෙන් සංවර්ධනය වන්නා වු නැගෙනහිර පළාතේ සිංහල, දෙමල, මුස්ලිම් ජනයාට නැවුම් වු අත්දැකීම් ගොන්නක් එක් කරමින් ත්‍රිකුණාමලය 'මැක්ස්සෙයිසර්' ක්‍රිඩාංගනයේදී **"EAST EXPO"** නමින් වු දැවැන්ත කෘෂිකර්ම හා වෙළෙඳ ප්‍රදර්ශණයක් 2011 සැප්තැම්බර් 23 සිට 27 දින දක්වා උත්සවශ්‍රීයෙන් පැවැත්විණි.

ලක්‍ෂ සංඛ්‍යාත ජනකායක් මෙම ප්‍රදර්ශනය නැරඹු අතර, ඒ සඳහා විශේෂිත හේතුවක් වුයේ ත්‍රිවිධ හමුදා අලංකාර ප්‍රදර්ශණ භූමි පෙළයි. එහිදී යුද හමුදාව කෙරෙහි ජනතාවගේ විශේෂ අවධානය යොමු වූ අතර, ඒ අතරින් පාබල අවි ප්‍රදර්ශණය සුවිශේෂ අංගයක් බවට පත්විය. විශාල ප්‍රදර්ශණ කුටියක් වු මෙහි පාබල සෙබළුන් විසින් භාවිතා කළ සහ දැනට භාවිතා කරන අවි වර්ග විශාල ප්‍රමාණයක් ප්‍රදර්ශණය කළහ.

22 වන සේනාංකාධිපති තුමාගේ ඉල්ලීම පරිදි 223 බළසේනාධිපතිගේ උපදෙස් මත 15 ශ්‍රිලපාහ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් කේටීපී ද සිල්වා ආර්ඒස්පී පීඒස්සී ශ්‍රිලපාහ ගේ පූර්ණ අධීක්‍ෂය හා මග පෙන්වීම යටතේ 15 ශ්‍රිලපාහ නිලධාරින් හා සෙසුනිලයින් විශාල ප්‍රමාණයක් දිවා රාත්‍රී වෙහෙස වී දැඩි කැපවීමක් කොට මෙම අලංකාරවත් මෙන්ම පාබල හමුදා ප්‍රෞඪත්වය ඔප් නංවන්නා වු ප්‍රදර්ශණ කුටිය ඉදි කරනු ලැබිණි.




15 වන බළඇණිය ශ්‍රි ලංකා පාබල හමුදාව මගින් ඉදි කරනු ලැබු මෙම පාබල අවි ප්‍රදර්ශණ කුටිය ප්‍රදේශය භාර උසස් ත්‍රිවිධ හමුදා සහ සිවිල් නිලධාරින්ගේ පැසසුමට ලක්වු අතර, එයට ප්‍රධානතම හේතුව වුයේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලයින් වෙතින් දක්වු කැපවීම තුළින් ඉතා උසස් මට්ටමකින් එම ප්‍රදර්ශනය නිර්මාණය කරදීමයි.

ශ්‍රි ලංකා පාබල හමුදාවේ අභිමානයට නව ජීවයක් එක් කරමින් ඉදිවුණු මෙම පාබල අවි ප්‍රදර්ශණ කුටිය **"EAST EXPO"** ප්‍රදර්ශණ භූමිය තුළ යුද හමුදා භූමිකාවේ ශ්‍රි ලංකා පාබල හමුදා අනන්‍යතාවය මැනවින් පිළිබිඹු කළේය.

**බුද්ධි අංශය 15 ශ්‍රිලපාහ**





# 20 ශ්‍රීලපාහ තෙවන සංවත්සරය උත්සව ශ්‍රීයෙන් සමරයි





ශ්‍රී ලංකා පාබල හමුදාවේ 20 වන බළඇණිය 2008.12.01 දින ඓතිහාසික මිහින්තලය පුරවරය මහාකනදරාව කඳවුරේ ස්ථාපනය කරන ලදී. ප්‍රථම අණදෙන නිලධාරි වන ලුතිතන් කර්නල් ඊඡ්පී එදිරිවීර ශ්‍රීලපාහ ගේ අණදීම යටතේ ආරම්භ වු මෙම බළඇණිය වත්මන් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් පීජේපී ගමගේ ආර්එස්පී ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් 2011.12.01 දින පුනරින් අක්කරායන්කුළම් යුද හමුදා කඳවුරේදි තෙවන උපන්දිනය සමරන ලදී.

ආගමික කටයුතු වලට මුල් තැන දෙමින් අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිදුන් අභියසදි ඒකක ධජයට සෙත් පැතිම හා ඒකකයේ මියගිය රණවිරුවන්ට හා තුවාල ලබා රෝහල් ගත කර සිටින රණවිරුවන් හා දැනට රාජකාරියේ නියුතු සියලුම නිලයින් හට ඔවුන්ගේ ඥාතින්ට, සිවිල් සේවක මහතුන්ට හා ඔවුන්ගේ ඥාතින්ට සෙත් පැතිම 2011.11.26 දින ඒකක දෙවන අණදෙන නිලධාරි, රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුළු සියලුම කණ්ඩායම් නියෝජනය වන පරිදි නිලධාරි අණදෙනවරුන් සහ සෙසුනියින්ගේ සහභාගිවී ශ්‍රී මහා බෝ සමිදුන් වෙත මල්, පහන්, දැහැත්, ගිලන්පස සහ අටපිරිකර පුජා කරමින් ආගමික වතාවත් සිදු කරන ලදී. අනතරුව අනුරාධපුර ''සරණ සෙවන'' බාළිකා ළමා නිවාසයේ දැරියන් සඳහා පාසල් උපකරණ ලබා දෙමින් ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් දායක විය.

2011.11.30 වන දින අණදෙන නිලධාරිගේ සහ දෙවන අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් ඒකක පුජා භූමිය වෙත කිලිනොච්චි ලුම්බිනි විහාරාධිපති හිමියන් වැඩමකරවා බෝධි පුජා පුණ්‍ය කර්ම ඉටු කරමින් බළඇණියේ ඉදිරි ගමන සඳහා සුබාශිංෂණ ප්‍රාර්ථනා කරන ලදී.

2011.12.01 දින 0830 පැයට අණදෙන නිලධාරි වෙත සම්මාණ මුරයක් හා පෙළපාළියක් ද සියලු නිලයින් උදෑසන තේපැන් සංග්‍රහයක් ද පවත් වන ලදී. අනතුරුව, විවිධ ක්‍රිඩා ඉසව් වල නියැලෙමින් හටපිරිස්හි කණ්ඩායම් හැගිම් හා එකමුතු බව වර්ධනය කිරීමේ අදිටනින් ක්‍රිඩා තරඟ පවත්වන ලදී. අවසානයේදී සියලු නිලයින් වෙනුවෙන් සුදානම් කරන ලද දිවා භෝජන සංග්‍රහය ද අණදෙන නිලධාරි ඇතුළුව සියලු නිලයින් විසින් සතුටින් භුක්ති විදන ලදී.





ක්‍රිඩා කෞෂල්‍ය හා යුද භූමියේදි ''සේවය කරමි'' යන ආදර්ශ පාඨය නොපිරිහෙලා ඉටු කරමින් දැනට රාජකාරීන් ඉටු කරන ප්‍රදේශයේ සිවිල් ජනතාව සමග සුහදශීලිව හා ජනතාවගේ සිත් දිනා ගනිමින් ඔවුන්ගේ ගෞරවයට ලක් වෙමින් ඒකකය වෙත පැවරෙන රාජකාරීන් සතුටුදායක ලෙස ඉටු කිරීමට අප බළඇණියට හැකි වී තිබේ. සමස්ත යුද හමුදාවේත් පාබල හමුදාවේත් ගෞරවය සුරකිමින් අභිමානය රැකගනිමින් තෙවන සංවත්සරේ අවසන් අංගය ලෙසින් සියලුම නිලයන් සහ ප්‍රදේශවාසින් වෙනුවෙන් රාත්‍රි සංගිත ප්‍රසංගයක් ද උත්සවාකාරයෙන් පවත්වන ලදී.

**බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ**



වර්ෂ 2011 වූ නොවැම්බර් මස 24 වන දින රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ශ්‍රිලපාහ 07 වන අණදෙන නිලධාරි වශයෙන් නි/61688 ලුතිනන් කර්නල් ඩීජ්කේ දිසානායක ආර්එස්පී ශ්‍රිලපාහ තනතුරෙහි වැඩ භාර ගැනිම සිදු විය. නව අණදෙන නිලධාරි වෙත භටපිරිස් විසින් සම්මාන ආචාර මුරය පිරි නමන ලද අතර, අනතුරුව, පෙරවරු 11.17 පැයට යෙදී තිබු සුබ මොහොතින් සම්ප්‍රදායානුකූලව මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනය හා සියල්ලන්ගේ ආශිර්වාදය මැද නව තනතුරේ රාජකාරි භාරගන්නා ලදී. නව අණදෙන නිලධාරි විසින් සියලු භටපිරිස් අමතමින් ක්‍රියාන්විත වලදී ජීව දානය දුන් නිලධාරීන් හා සෙසුනිලයන් හට නිවන්සුව ප්‍රාර්ථනා කරමින් ද සටනේදී කාය දානය දුන් සියලුම අයවලුන් හට ඉක්මන් සුවයද ප්‍රාර්ථනා කරන ලදී.

## රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ 07 වන අණදෙන නිලධාරි



රෙජිමේන්තු මූලස්ථාන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත පා තැබූ 07 වන අණදෙන නිලධාරි තුමණි මෙම බළඇණිය සෙසු ඒකකයන් අතර, සුවිශේෂි ස්ථානයක් කරා රැගෙන යාමටත් ඔබගේ ඉදිරි සැලසුම් සියල්ල සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා! යැයි බළඇණියේ සියලුම අයවළුන්ගේ ප්‍රාර්ථනයයි. අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලධාරි සහ සෙසුනිලයන් හටත් "ශ්‍රී දළදා සමිඳුන්ගේ පිහිට හා ආරක්ෂාව ලැබේවා" යැයි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

**මූලස්ථානය රෙජිමුබ ශ්‍රිලපාහ**





# ශ්‍රීලපාහ කබඩි කණ්ඩායම ඓතිහාසික ඉන්දියානු සංචාරයක

## ක්‍රීඩා පුවත්




සමස්ත යුද හමුදාවේම කබඩි ශූරතාවය දිනා අප ශ්‍රීලපාහ රෙජිමේන්තුවට මහත් කීර්තියක් අත්කර දුන් ශ්‍රීලපාහ කබඩි කණ්ඩායම පසුගියදා ඉන්දියානු ප්‍රාන්ත කබඩි තරඟාවලියකට සහභාගි වී අත්දැකීම් ලබාගැනිමට රෙජිමේන්තු අධිපති තුමා විසින් මන් පෙත් විවර කරදෙන ලදී.

මෙම ලිපියෙහි මාතෘකාවෙහි "ඓතිහාසික ඉන්දියානු සංචාරය" ලෙස නම් කිරීමට හේතු ගණනාවකි. එනම් යුද හමුදා කබඩි ඉතිහාසයේ රෙජිමේන්තු කණ්ඩායමක් විදේශිය තරඟ සංචාරයක නියලුනු ප්‍රථම අවස්ථාව මෙම සංචාරය වේ.

රෙම ශ්‍රීලපාහ හි එදා මෙදා ක්‍රීඩා ඉතිහාසයේ ප්‍රථම වතාවට කණ්ඩායමක් ලෙස විදේශිය තරඟාවලියකට සහභාගි වූ ප්‍රථම අවස්ථාවද මෙය වේ. තවද සමස්ත යුද හමුදාවේම ඈත අතිතයේදි අවස්ථා කිහිපයකදි විවිධ ක්‍රිඩා නියෝජනය කරමින් රෙජිමේන්තු කණ්ඩායමක් විදේශිය සංචාරවල සහභාගිව ඇති වුවද අතිගරු ජනාධිපති තුමාගේ නායකත්වයෙන් ත්‍රස්තවාදය රටින් තුරන් කළ යුද හමුදාව රෙජිමේන්තු කණ්ඩායමක් විදේශිය තරඟාවලියකට සහභාගි වූ ප්‍රථම අවස්ථාව මෙය විම සත්‍ය වශයෙන්ම ඓතිහාසික අවස්ථාවක් වේ.




ආසියානු කලාපීය විවිධ ජාතින් නියෝජනය කරමින් තරුණයින් අතර, සාමය සහ සහෝදරත්වය වර්ධනය කිරිමේ අරමුණින් "ඉන්දියානු හයිදබාද් කබඩි සංගමය" මගින් රටවල් අතර අන්තර් සමස්ත මට්ටමේ තරඟාවලියක් ලෙස ආසියානු ශූරතා කබඩි තරඟාවලියක් 2011 දෙසැම්බර් මස 09 දින සිට 2011 දෙසැම්බර් මස 11 වන දින දක්වා ඉන්දියාවේ හයිදබාද් නුවරදී සංවිධානය කොට තිබුණි.

මේ සඳහා ආසියානු කලාපීය රටවල් නියෝජනය කරමින් කණ්ඩායම් 08කට එම සංගමය ආරාධනා කරන ලද අතර, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රිඩා සමාජයක් ලෙසින් යුද හමුදා කබඩි ශූරතාව දිනාගත් ශ්‍රීලපාහ කණ්ඩායම සහභාගි විය.

උක්ත තරඟාවලිය සඳහා එහි කළමනාකරු වශයෙන් ලුතිනන් කර්නල් කේඑම්ඩබ්ආර් බංඩාර ශ්‍රීලපාහ ද පුහුණුකරු ලෙස මේජර් පීඒ්එම්එම් පෙරේරා ශ්‍රීලපාහ යන නිලධාරින් දෙදෙනා ඇතුලුව සෙසුනිලයන් 10 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් සහභාගි විය.

තරඟාවලිය ඒ සහ බී වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ ලිග් ක්‍රමයට කරග වැදීමට සලස්වා තිබු අතර, අප ශ්‍රීලපාහ කණ්ඩායම බී කාණ්ඩය යටතේ තරඟ වැදුණු අතර, එහිදී නේපාලය, තායිවානය, ඇෆ්ගනිස්ථානය යන ප්‍රබල කණ්ඩායම් පරාජයට පත්කර බී කොටසේ ඉදිරියට පැමිණි අතර, ඒ කාණ්ඩයේ ඉදිරියට පැමිණියේ සත්කාරක ප්‍රබල ඉන්දියානු කණ්ඩායමයි. ඒ අනුව 2011 දෙසැම්බර් මස 11 වන දින සවස හයිදබාද් නුවර ක්‍රීඩා පිටියේ අවසන් තරඟය පැවති අතර අවසන් තරඟය හර්යානා ප්‍රාන්තයේ මැති ඇමතිවරුන් ඇතුලු විශාල නරඹන්නන් සංඛ්‍යාවක් ඉදිරියේ තරඟය පවත්වන ලදී.

තරඟය ඉතාමත් තියුණු මුහුණුවරක් ගත් අතර සියලුම නරඹන්නන්ගේ ජයප්‍රිති ඝෝෂා ඉන්දියානු කණ්ඩායම වෙත ලැබුනි. එම තත්ත්වය යටතේ අධික මානසික පීඩනය මත වුවද අප කණ්ඩායම ප්‍රබල ක්‍රිඩා විලාශයක් පෙන්වමින් ප්‍රථම අර්ධය නිම වන විට ඉන්දියානු හයිදබාද් කණ්ඩායම ලකුණු 4ක් ලබා තිබියදී අප ශ්‍රීලපාහ කණ්ඩායම ලකුණු 3ක් ලබා තරඟය පාලනය කර තිබීම විශාල ජයග්‍රහනයකි.

දෙවන අර්ධයේදී ඉතාමත් ප්‍රවේග කාරි ක්‍රිඩා විලාශයක් පෙන්නුම් කළ ඉන්දියානු කණ්ඩායම ලකුණු 18/08 ලෙස තරඟාවලිය තමන්ට නතු කරගැනීමට සමත් වුහ.

එසේ වුවද සමස්ත තරඟාවලියේ අනුශූරතාවය දිනා ගැනිමද ශ්‍රීලපාහ කණ්ඩායමට ඓතිහාසික අවස්ථාවකි. මන්ද මීට පෙර ඉන්දියාවේ පැවති කබඩි තරඟාවලියකට සහභාගි වූ කිසිදු ශ්‍රී ලංකා කණ්ඩායමක් අවසන් මහා තරඟයක අත්දැකිම් විද නොමැති හෙයිණි.

කෙසේ නමුදු, මෙම තරඟාවලිය සැබවින්ම ශ්‍රීලපාහ ක්‍රිඩා වංශ කථාවේ ඓතිහාසික අවස්ථාවකි. ස්වර්ණමය අවස්ථාවක් ලෙස හැදින් වුවද එය අතිශෝක්තියක් නොවේ. සැබවින්ම මෙම තරඟාවලිය සඳහා මං පෙත් හෙලිකළ නියමුවා රෙජිමේන්තු අධිපති හා යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමන් වේ. ලැබූ අත් දැකීමත් ජයග්‍රහනයන් හරහා සමස්ත ශ්‍රීලපාහ ක්‍රිඩා කණ්ඩායම මහත් ප්‍රබෝධයකට, උද්යෝගයකට පත්ව ඇති අතර මෙය ශ්‍රීලපාහ ඉදිරි ක්‍රිඩා දියුණුවට ගත් යෝධ පියවරකි.

**ක්‍රිඩා අංශය රෙම ශ්‍රීලපාහ**



ක්‍රීඩා පුවත්

# දකුණු ආසියාතික කඹ ඇදීමේ තරඟාවලියේ අනුශූරතාවය දිනාගත් ශ්‍රී ලංකා කණ්ඩායමේ පාබල හමුදා ශක්තිවන්තයින්

ආසියානු කඹ ඇදීමේ සම්මේලනය හා ඉන්දියානු කඹ ඇදීමේ සම්මේලනය එක්ව සංවිධානය කළ දෙවන දකුණු ආසියානු කඹ ඇදීමේ තරඟාවලිය සහ රජීව් ගාන්ධි අනුස්මරණ ශූරතා තරඟාවලිය 2011 දෙසැම්බර් මස 28,29 සහ 30 යන තෙදින තුළ "ඉන්දියාවේ නවදිල්ලි" නුවරදී පවත්වන ලදී.

උක්ත තරඟාවලිය සඳහා ඉන්දියාව, නේපාලය සහ ඇෆ්ගනිස්ථානය යන රටවල් සහභාගි විය. මෙම තරඟාවලියේ ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කරමින් පහත සදහන් ජයග්‍රහණ ලබා ගනිමින් ලක් මාතාව රිදියෙන් බබලවන්නට පහත නම් සඳහන් පාබල හමුදා ශක්තිවන්තයන් උර දෙන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| සෙ/322088 | ලාකෝ | රණසිංහ | යූපීපී | - (රිදී පදක්කම) |
| සෙ/325173 | සාසෙ | විජේවීර | එම්එම් | - (රිදී පදක්කම) |
| සෙ/2003150 | සාසෙ | සුරංග | ජේඑච්එම් | - (රිදී පදක්කම) |
| සෙ/2023610 | සාසෙ | රංගන | බීඑච්පී | - (රිදී පදක්කම) |

# 2011 රූපවාහිනී වොලිබෝල් තරඟාවලියේ යුද හමුදා කණ්ඩායම නියෝජනය කළ ශ්‍රීලපාහ ක්‍රීඩා තරු

ජාතික තරුණ සේවා සභාව සහ ජාතික රූපවාහිනිය එක්ව 27 වන වරටත් සංවිධානය තරන ලද තරුණ සේවා ජාතික වොලිබෝල් ශූරතාවලිය 2011 දෙසැම්බර් මස 30 වන දින අති උත්කර්ෂවත් අන්දමින් මාතර රුහුණු විශ්ව විද්‍යාලීය ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී.

උක්ත තරඟාවලිය සුපර් ලීග් හා ආධුනික යන වශයෙන් කාණ්ඩ දෙකකින් පැවති අතර සුපර් ලීග් කණ්ඩායම සඳහා ලංකාවේ සුපිරිතම කණ්ඩායම් 08 ක් තරඟ වැදුනි. ඒ අනුව අවසන් තරඟය සඳහා යුද හමුදා කණ්ඩායමත් වරාය අධිකාරි කණ්ඩායමත් සුදුසුකම් ලබා ගන්නා ලදී.

අප රෙජිමේන්තුව නියෝජනය කරමින් යුද හමුදා කණ්ඩායමේ ලිබරෝ ක්‍රිඩකයා වශයෙන් ක්‍රිඩා කරනු ලැබුවේ සෙ/9ඩී01451 ලාකෝ ධීරසේකර ඩබ්ලිව්එල්ආර් ය. අවසන් තරඟය සඳහා වරාය අධිකාරි කණ්ඩායම ඔවුන්ගේ දක්ෂතා මත පස්වන වතාවටත් අඛණ්ඩව ශූරතාවය හිමිකරගත් අතර ඔවුන්ට ඉතාමත් ප්‍රබල අභියෝගයක් ලබා දුන් යුද හමුදා කණ්ඩායම අනුශූරතාවය හිමිකරගන්නා ලදී. එම තරඟාවලිය දක්ෂතම ආවරණය කරන්නාට හිමි සම්මානය දිනා ගැනිමට අප රෙජිමේන්තුවේ ලාකෝ ධීරසේකර සමත්වන ලදී.

තවද ආධුනික තරඟාවලියේ යුදහමුදා කණ්ඩායම නේත්‍රා කණ්ඩායම ලෙසින් තරඟ වැදුනු අතර ඔවුන්ගේ ප්‍රතිවාදී කණ්ඩායම වුයේ ගම්පහ සියනෑ තරු ක්‍රීඩා සමාජයයි. එම තරඟය විශිෂ්ට ලෙස තරඟ කළ යුද හමුදා නේත්‍රා කණ්ඩායම ශූරතාවය දිනා ගන්නා ලදී. එම තරඟයේ දක්ෂතම ක්‍රීඩකයා හා හොදම පන්දු පිරිනමන්නා යන සම්මාන දෙකම දිනා ගැනිමට අප රෙජිමේන්තුවේ ආධුනික සෙබළ ප්‍රනාන්දු ඩබ්ලිව්එස්ආර් යන ක්‍රිඩකයා සමත්විය. ඇත්තෙන්ම එය අප රෙජිමේන්තුවට ගෞරවයකි.

**ක්‍රිඩා අංශය රෙම ශ්‍රීලපාහ**

## අද යන මග

සිත් සතන් අද වැනසිලා
නපුරුකම් බෝ මතුවෙලා
කොතනටද මිනිසුනේ
දිවි මග මේ යන්නේ
මිනිසත් බව පසෙකලා

සාරධර්ම ගුණධර්ම ගැන කතා කරන්නේ
සක්විති රජවෙන්නයි ඒ හැම පවසන්නේ
තරඟයකි අද මේ ලොව තුළ ඇත්තේ
මවත් පියාවත් නැහැ දූන් අඳුනන්නේ

බුදු සමිඳුන් දෙසුව දහම අනුවද මේ අප යන්නේ
තමන් ගැනම සිතන ලොවක් නොවේද මේ ගොඩ නැගෙන්නේ
කෙලෙසද මිනිසුනේ අප සැම මේ ලෙස නිවනට යන්නේ
මිරිගුවක වෙලී අඳුරේ නොවේද ඔබ දිවයන්නේ

**15 ශ්‍රීලපාහ මියගිය මේජර් (උපා) ඩීආර් ප්‍රනාන්දුගේ**
**දියණිය ඩී චමරි ගයාන්තිකා ප්‍රනාන්දු**

## දයාබර චුටි දියණියේ...

සුමුදු පොඩි අත් යුග මතින්
පොත් බෑගය පිටමත එල්ලාගෙන
ඇද හැලෙන පිණි බිංදු දහරාවන් අතරින්
දඟ කරන පුංචි සමනල පැටික්කියක් සේ
ඔබ පිය නඟන හැටි විදු පියස වෙත
මා බලා සිටිනුයේ පැතූ සුන්දරම
සුන්දර සිහිනයේ සිතුවිලි දහරාව
නුඹම වු නිසාවෙනි, දයාබර දියණියේ...
අධ්‍යාපන මාවතේ හමුවන සියළු බාධක
බිඳ හෙලා එහි කිරුළ පළඳින්න
ප්‍රාර්ථනා ගෙන එන්නෙමි
දයාබර චූටි දියණියේ මා ඔබට...

ලුතිනන් (උපා) පීජ් චන්‍ද්‍රවිමල් ශ්‍රීලපාහ
18(සෙව්) ශ්‍රීලපාහ

# 2011 ශ්‍රීලපාහ අන්තර් ඒකක කඹ ඇදීමේ කිරුළ 8 ශ්‍රීලපාහට



යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමාගේ ප්‍රධානත්වයෙන් දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේ පැවති 2011 පාබල හමුදා අන්තර් ඒකක මළල ක්‍රීඩා උළෙලේදී කඹ ඇදීමේ කිරුළ 8 වන ශ්‍රී ලංකා පාබල හමුදාව දිනාගන්නා ලදී. නිවැරදි මඟපෙන්වීම සහ සියලු අයවළුන් උනන්දුවෙන් කැපවීමෙන් සහ නොසැලෙන අධිෂ්ඨානයෙන් එකමුතුව කටයුතු කිරීම මෙම ජයග්‍රහණය ලබා ගැනීමෙහිලා ඉවහල් වූ බැව් සඳහන් කරමු.

බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ

# 12 ශ්‍රීලපාහ සිව්වන සංවත්සරය අභිමානයෙන් සමරයි...

මියගිය රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින් ඒකකය වෙත ගෙන්වා මියගිය රණවිරුවන්ටත් එම පවුල්වල සාමාජිකයින්ටත් සෙත්පතා විවිධ වූ පිංකම් පවත්වා එම රණවිරුවන්ටත් දෙමාපියන්ටත් උපහාර උළෙලක් පවත්වමින් සැමරූ තුන්වන සංවත්සරයේ අභිමානය පෙරටු කරගෙන මෙවර අප විසින් හතරවන සංවත්සර උත්සවය සමරනු ලැබුවේද ආගමට දහමට මුල්තැන දෙමිනි.

මියගිය රණවිරුවන්ට සෙත්පතා 2011.11.27 දින කතරගම කිරිවෙහෙර අභියසත්, අනතුරුව 2011.12.29 දින අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය අභියස බෝධිපූජා පිංකම් පවත්වා මියගිය රණවිරුවන් හට සෙත් පැතීමක් සිදු කරන ලදී.

අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ඒඑම්සීපී විජයරත්න ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ මගපෙන්වීම මත සියලුම නිලධාරින් සහ සෙසුනිලයින් සහභාගිත්වයෙන් අනුරාධපුර කිරිඉබ්බන්වැව විහාරස්ථානයේ විහාරාධිපති ඒකකය වෙත වැඩමවා බළඇණියේ බෝධිය අභියස බෝධි පූජා පිංකමක් පවත්වා මියගිය රණවිරුවන් හට සෙත්පතන ලදී.

මෙවර බළඇණි සංවත්සර උත්සවයේ ප්‍රධානතම අංගය වූයේ ආබාධිත සෙබළුන් ඒකකය වෙත ගෙන්වා උපහාර උළෙලක් පැවැත්වීමයි. ඒකකය සමගින් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් තුවාල ලබා දැනට ආබාධිත හේතුන්මත රෙජිමූබ වෙත ඇතුලත් කර සිටින නිලධාරින් සහ සෙසුනිලයින් විශාල පිරිසක් ඒකකය වෙත ගෙන්වා ජාතියට නිදහස උදාකරලීම උදෙසා ඔවුන් විසින් සිදු කළා වූ ඒ අමිල කැපකිරීම වෙනුවෙන් උපහාර උළෙලක් පවත්වන ලදී.

බළඇණි හතරවන සංවත්සරය සැමරීම වස් 2011.12.03 වන දින අණදෙන නිලධාරි විසින් බළඇණි ධජය සහ කණ්ඩායම් නිලධාරි අණදෙන වරුන් විසින් කණ්ඩායම් ධජ ඔසවා බළඇණි දිනයේ සමාරම්භය සනිටුහන් කරමින් රෙජිමේන්තු ගීතය ගායනා කරන ලදී. අනතුරුව අණදෙන නිලධාරි විසින් බළඇණි දිනයේ වැදගත්කම වටහා දෙන ලදී.

පසුව අණදෙන නිලධාරි විසින් ආබාධිත සෙනින්ගේ ගැටලු විමසා ඒ වෙනුවෙන් විසඳුම ලබාදීමට කටයුතු සිදු කරන ලදී. අනතුරුව සංචාරක පුරවරයක් ලෙස ක්‍රමයෙන් දියුණු වන මුලතිව් ප්‍රදේශයේ සංචාරයක අත්දැකීමද ඔවුන් හට ලබාදෙන ලදී. එදින දහවල් සියළු නිල දිවා භෝජන සංග්‍රහයක් පවත්වා බළඇණි දිනයේ සතුට සැම සියලු දෙනා අතරේම බෙදා ගත්තේ බළඇණි සංගීත කණ්ඩායමේ මියුරු සංගීත රාවය මධ්‍යයේය.

බළඇණි හතරවන සංවත්සර උත්සවයේ වටිනාකම තවත් වැඩි කරමින් 2011.12.04 වන දින නිලධාරින්ගෙන් සහ සෙසුනිලයින්ගෙන් සැදුම්ලත් පෙළපාළියක් හා සම්මාන මුරයක් අණදෙන නිලධාරි වෙත පිරිනමන ලදී. අනතුරුව බළඇණියේ සියළු නිලධාරින් සහ සෙසුනිලයින් වෙනුවෙන් සුහඳ හමුවක් පැවැත්වීමටද කටයුතු කළේ බළඇණි දිනයේ සතුට වැඩි කරනු වස් ය. එසේම අප බළඇණියේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන්ට ද බළඇණි දිනයේ සතුට බෙදා ගැනීමට කටයුතු සලසා දෙන ලදී.

ආබාධිත රණවිරුවන් වෙනුවෙන් උපහාර පිරිනැමීමේ අරමුණ පෙරදැරි කරගෙන සමරන්නට යෙදුනාවූ හතරවන සංවත්සර උත්සවයේ සමාප්තිය සනිටුහන් කරමින් ආබාධිත රණවිරුවන් නැවත පනාගොඩ යුද හමුදා කඳවුර වෙත පිටත්කර යවන ලදී. එසේම බළඇණි හරතවන සංවත්සර උත්සවය නිමා කරනු ලැබුවේ බළඇණියේ ඉදිරි ගමනට සුබාශිංසනය ප්‍රාර්ථනා කරමිනි.

බුද්ධි අංශය 12 ශ්‍රීලපාහ

# 15 ශ්‍රීලපාහ "දිරිය ශක්ති සෙවන" සෙබළ නිවහන

වසර 04 කට ආසන්න කාලයක් උතුරු හා නැගෙනහිර විවිධ ප්‍රදේශයන්හි රාජකාරී කරනු ලැබූ ශ්‍රීලපාහ ඒකකය වෙත ස්වකීය කඳවුරක අවශ්‍යතාවය දැඩිව මතු වී තිබුනි. මේ සබැඳිව දැනුවත් කිරිමෙන් අනතුරුව ත්‍රීකුණාමල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිතුමන් විසින් අප රෙජිමේන්තුවෙහි සිටි ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකු වශයෙන් ඒකකය වෙත දක්වන විශේෂ සැලකිල්ලක් ලෙස තඹලගමුව ප්‍රදේශයේ අක්කර 3 1/2 පමණ වූ භූමි භාගයක් පවරාදෙන ලදී.

ඒකකය වෙත මහත් සම්පතක් වූ මෙම භූමි භාගය තුළ තමන්ගේම කඳවුරක් ඉදි කර ගැනීම සෙබළුන්ගේ මීළඟ





අරමුණ විය. ප්‍රථමයෙන් ඔවුන් වල් බිහිවී පැවති භූමිය එළි පෙහෙළිකොට කඳවුර තුළ ප්‍රථම හටනිවාසය සැදිමට ඇවැසි බිමක් ලහි ලහියේ සකස් කර ගත්හ.

ඉන් අණතුරුව සිදුකරනු ලැබුවේ හටනිවාසය ඉදි කිරීම සඳහා මූලිකව අවශ්‍ය වන ගල් වැලි ආදි අමු ද්‍රව්‍ය සොයා ගැනීමයි. සෙබළුන් විසින් සිය ශ්‍රමය උපරිමයෙන් කැපකොට එම සම්පත් ප්‍රාදේශීයව සොයා ගැනීමට සමත් වූහ. තඹලගමුව ප්‍රාදේශිය ලේකම් තුමාගේ අවසරය හා උපදෙස් මත සෙබළුන්ගේ ශ්‍රමයෙන් වැලි ගොඩදැමීම සිදු කෙරුණ අතර හටනිවාසය සඳහා ඇවැසි සම්පූර්ණ වැලි ප්‍රමාණය සෙබළුන් විසින් ගොඩදමා ප්‍රවාහනය කරනු ලැබීය. අත්තිවාරම සඳහා අවශ්‍ය කලුගල් සියල්ලම ප්‍රාදේශීයව සොයාගැනීමට ඔවුන් සමත් වූනි. දානපතින්ගෙන් ලැබුන ආධාර මුදල් වලින් සිමෙන්ති ලබාගත් අතර, 2011 ක් වූ ජූනි මස 15 වන දින අභිනව හටනිවාසය සඳහා මුල් ගල තැබීම අණදෙන නිලධාරි තුමන් අතින් සිදු කෙරිණි.

අත්තිවාරමේ වැඩකටයුතු කඩිනමින් නිමා කිරීමට සමත් වූ සෙබළුන් ගඩොල් සෑදීමට මැටි ලබා ගැනීමට ප්‍රදේශවාසි දානපතියෙකු විසින් ලබාදුන් භූමියක් ප්‍රයෝජනයට ගත් අතර දිනපතා මහත් වූ ශ්‍රමයක් වැය කරමින් සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා ගඩොල් නිෂ්පාදනය කිරීමට ඔවුන් සමත් වූහ. ගඩොල් පොරනු ඉදි කොට පුළුස්සා ඉතා ගුණාත්මක තත්ත්වයෙන් යුතුව ඉදිකිරීම සඳහා ගඩොල් නිෂ්පාදනය කිරීමේ නිපුණතාවයක් මෙන්ම පන්නරය මේ තුළින් ලබා ගැනීමට ඔවුන් සමත් වූහ.

හටනිවාසය ආරම්භයේ සිටම එහි වැඩකටයුතු නිමාවන තෙක්ම සෙබළුන් තම ශ්‍රමය නොකඩවා කැපකරනු ලැබුවේ තමාගේම කඳවුරක රාජකාරී කොට, තමන් වෙනුවෙන්ම ඉදි කෙරුණ හටනිවසක කාලය ගත කිරීමට ඔවුන් තුළ පැවති උනන්දුව හා අධිෂ්ඨානය මත බැව් පැහැදිලිය. ගොඩනැගිල්ලේ වැඩ කටයුතු ආරම්භ වීමත් සමගම එහි අවසානය දක්වාම ඒ ඒ ශිල්පයන් කෙරෙහි නිපුණත්වයක් ඇති සෙබළුන් බළඇණිය තුළින්ම ඉදිරිපත් වීම හා ඒ සඳහා සිය උපරිම දායකත්වය ලබාදී අවට පරිසරය සුන්දර වටපිටාවක් බවට පත් කිරීම සඳහා ඔවුහු දිවා රෑ නොබලා සිය ශ්‍රමය කැප කළහ.

සෙබළ සහෝදරත්වයේ මහත් ඵලයක් වූ සෙබළුන්ගේ දිරියෙන් ශක්තියෙන් ඔවුන්ගේ දැතින්ම ඔවුනට ඉදි වූ මෙම හටනිවාසය ත්‍රිකුණාමල දිසාපතිතුමන් විසින් 2011 ක් වූ ඔක්තෝබර් මස 31 වන දින සෙබළ අයිතියට පවරාදෙන ලදී.

අඩි 20x80 ප්‍රමාණයේ හටනිවාසයක් වූ මෙම ගොඩනැගිල්ලෙහි පිරිවැය වටිනාකම රුපියල් මිලියන 2 ක් පමණ වන අතර සෙබළුන්ගේ කැපවීම තුළින් රුපියල් ලක්ෂ 4 ක් වැනි මුදලකට අංග සම්පූර්ණ හටනිවාසයක් ඉදි කිරීමට මෙම බළඇණිය සමත් වූ බැව් සතුටින් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු. එසේ හැකිවීමට හේතුව අන් කවරක් නොව ඒකක අණදෙන නිලධාරි තුමා විසින් දින පතාම එම වැඩකටයුතු අධීක්ෂණය කර අවශ්‍ය ශිල්පීය තාක්ෂණය නිරන්තර දිරි ගැනවීම යටතේ සෙබළුන්ගේ කැපවීම හා උත්සාහය බැව් කිව යුතුය,

සෙබළුන් විසින් කාලය ශ්‍රමය කැපකොට ස්වකීය පරිහරණය සඳහා ඉදිකරගත් මෙම හටනිවාසය ''දිරිය ශක්ති සෙවන'' ලෙස නම් විය.

**බුද්ධි අංශය 15 ශ්‍රීලපාහ**







# 18(සෙව්) ශ්‍රීලපාහ තුන්වන බළඇණි සංවත්සරය



ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 17 වන සමාජිකයා ලෙස 2009.01.01 දින ස්ථාපනය කරනු ලැබු 18(සෙව්) ශ්‍රීලපාහ ඒකකය සිය අභිමානවත් තෙවන බළඇණි සංවත්සරය ඒකක අණදෙන නිලධාරි මේජර් ඩබ්ඡ්වයිකේ වීරසිංහ ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් ඒකක මුලස්ථාන කඳවුර මරදන්කේනි හිදි ආගමික වතාවත් වලට මුල් තැන දෙමින් පවත්වන්නට යෙදුනි.



2011.12.31 වන දින යාපනය නාගවිහාරස්ථාන හිමිනමක් ඒකකය වෙත වැඩම කරවා ධර්මානුශාසනාවක් පවත්වා පිරිකර පූජා කර ක්‍රියාන්විතයේදි මියගිය අයවලුන් හට පිං පැමිණවීම සහ තුවාල ලැබු සෙනින් හට ඉක්මන් සුවය ප්‍රර්ථනා කිරීම ද, දැනට සේවයේ නියුතු සියලුම නිලධාරින් සහ සෙසුනිලයින් හට තමන්ට පැවරෙන ඕනෑම රාජකාරියක් ''සේවය කරමි'' යන රෙජිමේන්තු උදෘතපාඨය පෙරදැරිව නොපිරි හෙලා ඉටු කිරීමට ත්‍රිවිධ රත්නයේ ආරක්‍ෂාවෙන් අවැසි ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනය කරන ලදී.

2012.01.01 දින උදෑසන 0900 පැයට ඒකක අණදෙන නිලධාරි හට කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම සිදු විය. එදින 0930 පැයට අණදෙන නිලධාරි විසින් සියලුම හටපිරිස් අමතා සංවත්සරය නිමිතිකොට විශේෂ දේශනයක් සිදු කළහ. එහිදී අණදෙන නිලධාරි විසින් වසර තුනක් වැනි කෙටි කලක් තුළ ඒකකය ලබා ඇති දියුණුව සියලුම අයවලුන්ගේ එකමුතුව හා සමගියෙන් පැවරෙන ඕනෑම රාජකාරියක් ඉටු කිරිම නිසා ලබා ඇති බව පවසා සියලු දෙනා හට ස්තුති කරමින් ඒකක ප්‍රථම අණදෙන නිලධාරි මේජර් යු වනිගසූරිය ශ්‍රීලපාහ ඒකක නගා සිටුවීමේදි කළ මෙහෙයද සිහිපත් කළහ. ඒකක සියලුම සාමාජිකයින් විසින් සුදානම් කර තිබු තේ පැන් සංග්‍රහය අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලයින් විසින් භුක්ති විදි අතර, ඉන් පසු බළඇණියේ සියලුම සාමාජියින් සමූහ ඡායාරූපයකට පෙනි සිටින ලදී. මෙහිදි සියලුම රණවිරුවන්ගේ කැපවීමෙන් උතුරු නැගෙනහිරට සාමය උදාකර දීමත් සමඟ ඇති වු සාමකාමි වාතාවරණය මත ඒකකයේ වැඩි සාමාජිකයින් සංඛ්‍යාවක් මෙදින බළඇණි සංවත්සරය සැමරිම වෙනුවෙන් සහභාගි වීම කැපී පෙනුණි. ඉන් අනතුරුව ඒකකයේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන් සියලු දෙනාහට ත්‍යාග පිරිනැමීම අණදෙන නිලධාරි සුරතින් සිදු කරන ලදී.

ඒකක සංවත්සරය වෙනුවෙන් කණ්ඩායම් අතර, පවත්වන ලද කඹ ඇදිම, අත්පන්දු, ක්‍රිකට් තරඟ අතරින් අවසන් තරඟ සඳහා සුදුසුකම් ලැබු කණ්ඩායම් අතර, ක්‍රිඩා තරඟ ඒකක අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් කදවුරු ක්‍රිඩා පිටියේදි පවත්වන ලදී. කණ්ඩායම් හි සියලුම අයවලුන් උද්යෝගයෙන් යුතුව තම කණ්ඩායම් දිරිමත් කරන ලදී. ක්‍රිඩා තරඟ අවසානයේ සියලුම සාමාජිකයින් හට සුදානම් කර තිබු භෝජන සංග්‍රහය මංගල උත්සවයක සිරිගත් අතර, අණදෙන නිලධාරි ඇතුලු සියලු දෙනා සතුටින් භුක්ති විදින ලදී. එදින සවස නාග විහාරයේ වැඩ වසන හිමි නමක් වැඩමවා බෝධි පුජාවක් පවත්වා ඒකක සංවත්සරය සහ 2012 නව වසර වෙනුවෙන් සියලු දෙනා වෙනුවෙන් සෙත්පතා පිරිකර පුජාවක් පවත්වන ලදී. මෙහිදි ඒකක ''සී'' කණ්ඩායමේ කණ්ඩායම් බලලත් නිලධාරි වර්ණ සැරයන් මොහොට්ටි විසින් සිය දෙමාපියන්ට පිං පිණිස අටපිරිකර පුජාවක් ද සිදු කරන ලදී.

2012.01.05 වන දින රාත්‍රියේ ඒකක බනි/සැරයන් නිවස්නයේ රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු සියලුම සාමාජිකයින් විසින් සේනාංක බළ ප්‍රදේශයේ ස්ථානගත සේමු/බසේමු/ඒකක හි රෙජිමේන්තු සැරයන් මේජර් වරුන්ට ආරාධනා කර අණදෙන නිලධාරි, දෙවන අණදෙන නිලධාරි, විධායක අධිකාරි හා උපානිගේ සහභාගිත්වයෙන් සාදයක් පැවැත්වු අතර, 2012.07.07 වන දින ඒකක සියලුම සෙසුනිලයින් හට විනෝද වීම සඳහා ආසේමු (යා) බළ ප්‍රදේශයේ රාජකාරි ආවරණය කිරීම සඳහා පැමිණ සිටි රෙමශ්‍රීලංසංබ අධිරිද්ම සංගිත කණ්ඩායම ගෙන්වා ඔවුන්ගේ මියුරු සංගිත නාදයට නිලධාරින් සහ සෙසුනිලයින්ගේ ගායන හැකියාවන් ප්‍රදර්ශනය කරමින් ගීත ගායනා කර සතුටු විමට අවස්ථාව උදා කර දෙන ලදී.

මෙසේ අති උත්කර්ෂවත් ලෙස සිය තෙවනි බළඇණි සංවත්සරය සැමරු 18(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලධාරින් හා සෙසුනිලයින්ටත් සමස්ත යුද හමුදාවේත් ශ්‍රී ලංකා පාබල රෙජිමේන්තුවේ ගෞරවය හා අභිමානය ආරක්‍ෂා කරමින් ''සේවය කරමි'' යන රෙජිමේන්තු උදෘත පාඨය අනුව යමින් පැවරෙන ඕනෑම රාජකාරියක් නොපිරි හෙලා ඉටු කිරීමට ත්‍රිවිධ රත්නයේ ආරක්‍ෂාවෙන් සියලු ධෛර්යය හා ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**ලුතිතන් (උපා) පිඒ චන්‍ද්‍රවිමල් ශ්‍රීලපාහ**
**18(සෙව්) ශ්‍රීලපාහ**



# 18(සෙව්) ශ්‍රීලපාහ වෙතින් තවත් ප්‍රජාසත්කාරයක්



දශක තුනක පමණ කාලයක් පුරා බෙදුම්වාදි එල්ටීටීඊ රුදුරු ත්‍රස්තවාදය හේතුවෙන් උතුරු නැගෙනහිර විශාල ජනතාවකට තම නිවාස අහිමි වූවා පමණක් නොව රජයේ දේපළ වලටද හානි පැමිණිවීමේ හේතුවෙන් එම පවුල්වල දූ දරුවන් ගේ අධ්‍යාපන කටයුතු ද අඩාල වී තිබුනි. මානුෂීය මෙහෙයුමෙන් පසු 18(සෙව්) ශ්‍රීලපාහ ඒකකය මරදන්කේනි ප්‍රදේශයේ ජනතාවටද ඇති එවැනි ගැටළුවලට යම්යම් විසඳුම් ලබා දීම වස් ඒකක අණදෙන නිලධාරි සියලුම අයවලුන් සමඟ නොයෙකුත් ප්‍රජා සත්කාරක වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙවර ඒ සඳහා තෝරාගනු ලැබුවේ ඒකක ''බී'' කණ්ඩායම ස්ථානගත මසාර් ප්‍රදේශයේ පිහිටි නාමගල් පෙර පාසලයි.

55 සේනාංකාධිපති තුමාගේ සංකල්පයකට අනුව 551 බළසේනාධිපති තුමාගේ උපදෙස් පරිදි මෙම ඒකක අණදෙන නිලධාරි මේජර් ඩබ්ළිව්වයිකේ වීරසිංහ ශ්‍රීලපාහගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඒකක ''බී'' කණ්ඩාම් නිලධාරි අණදෙන මේජර් ඩීඑස්පිකේ ද සිල්වා ශ්‍රීලපාහ ඇතුළු සෙසු අයවලුන්ගේ ශ්‍රම දායකත්වයෙන් යුතුව මෙම පෙර පාසලේ වැඩ කටයුතු ඉතා කෙටි කාලයක් තුළ නිමකර ගැනිමට හැකි විය. කුඩා දරුවන් 20 ක් පමණ ඉගෙනුම ලබන මෙම පෙර පාසල පවත්වාගෙන ගිය තාවකාලික ගොඩනැගිල්ල වෙනුවට ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර කුඩා දරුවන්ට විනෝද වීම සඳහා ක්‍රීඩා භූමියක් හා වැසිකිළි පද්ධතියකින්ද සමන්විත වන පරිදි ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදී.

ප්‍රදේශයේ කුඩා දූ දරුවන්ගේ නෙත් සිත් පහන් කිරමේ අරමුණින් යුතුව ඉදි කළ මෙම පෙර පාසල 2012.01.16 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. එම අවස්ථාවට 55 සේනංකාධිපති, 551 බළසේනාධිපති, ඒකක අණදෙන නිලධාරි , ''බි'' කණ්ඩායම් නිලධාරි අණදෙන මෙන්ම යුද හමුදා නිලධාරි/සෙසුනිලයින් විශාල පිරිසක්ද, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, මාසාර් දෙමළ මිශ්‍ර පාසලේ විදුහල්පති තුමා, පෙර පාසලේ ගුරුතුමිය ඇතුළු ප්‍රදේශවාසින් රැසක් සහභාගිවන ලදී. මෙදින පෙර පාසලේ ඉගෙනුම ලබන දූ දරුවන්ගේ විවිධ ප්‍රසංගයක් පැවැත්විය. එම දූ දරුවන්ට තෑගි බෙදා දීමක්ද සිදු කළ අතර, සියලුදෙනා හට තේ පැන් සංග්‍රහයක්ද ලබා දෙන ලදී.



මෙවැනි සත්කාරක වැඩසටහන් තුළින් යුද හමුදාව හා සිවිල් ජනතාව අතර, හොද හිත වර්ධනය වෙනවා මෙන්ම යුද හමුදාව පිළිබඳ ඔවුන් විශ්වාසයක් ද තබනු ඇත.

**සෙ/18ඩී00240 කෝප්‍රල් පතිරන එච්පීජ් - 18(සෙව්) ශ්‍රීලපාහ**

## මගේ ජීවිතය



**අා මග කෙටියි**
**යා යුතු මග දුරයි**
**නුවනැස අවදියෙන්**
**තරණය කළ යුතුයි**
**මේ ඇරඹුමයි.**

බනි II නිහාල් කේඩබ්ලිව්ජ්
රෙජිමූබ ශ්‍රීලපාහ

## ඉගෙනිම කටු අත්තකි
## එහි ඵලය මල් ඉත්තකි...

අධ්‍යාපනය නමැති බීජය වැපිරීම සඳහා මනස නමැති භූමිය මැනවින් සකස් කර ගත යුතුය. එනම් අද සමාජයේ ශිෂ්‍ය පරපුර මුලින්ම කල යුත්තේ මනස නමැති භූමිය සකස් කරගැනීමයි. ඊට පසු අධ්‍යාපනය නැමැති බීජය වපුරා හොඳ සරු අස්වැන්නක් ලබා ගැනිමයි. ඒත් අද සමාජය ඊට හාත් පසින්ම වෙනස්ය.

මනස නමැති භූමිය සකස් කර නොගෙන අධ්‍යාපනය නමැති බීජය වපුරා නිසරු අස්වැන්නක් ලබා ගනී. ඉතින් මම පතන්නේ මේ ඉන්දියන් සාගරයේ ''මුතු ඇටය'' නමින් විරුදාවලියට පත් අපේ මාතෘ භූමියේ මනසින් උසස් සිසු පරපුරක් බිහිවේවායි යනුවෙනි...

**5 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම**
**රෝහණ ආර්වී ගේ දියණිය**









# කණ්ඩුල පුරාවත ග්‍රන්ථ යුගලයකින් එළි දැක්වේ

ගරු ආරක්ෂක සහ නාගරික සංවර්ධන ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇතුලු සම්භාවනීය අමුත්තන් රැසක් අභියස දෙසැම්බර් 18 වන දින පැවති උත්සවයකදි පුරා පනස් වසරක් පුරාවට අද දින දක්වා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මංගල සංකේතය වශයෙන් තම සේවය ඉටු කරන ''කණ්ඩුල'' ඇතු පිළිබඳව සම්පාදනය කරන ලද ග්‍රන්ථ දෙකක් උත්සවාකාරයෙන් එළි දක්වන ලදි.

යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු පීඑස්සී ගේ සංකල්පයකට අනුව සංවිධානය කරන ලද ''කණ්ඩුල'' මංගල හස්ථි වංශය පිළිබඳව කලාභවනේ පැවැති චිත්‍ර ප්‍රදර්ශණය අතරතුර මෙසේ එම ග්‍රන්ථ යුගල ද උත්සවාකාරයෙන් එළි දක්වන ලදි.

''කණ්ඩුල'' ඡායාරූප ප්‍රදර්ශනය එදින ( 18 ) පෙරවරුවේ යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ජගත් ජයසූරිය යුඑස්පී එන්ඩීයු පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් මහජනතාව සඳහා විවෘත කරන ලදී. දෙසැම්බර් 21 වන දින දක්වා උත්සවය මහජන ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් සියලු කටයුතු සංවිධානය කොට තිබිණි.

''කණ්ඩුල'' පුරාවත පිළිබඳ අභිනවයෙන් එළි දැක්වූ ග්‍රන්ථ යුගලය විසින් පාබල මංගල හස්ථියාගේ 50 වසරක ඉතිහාසය මැනවින් ඉදිරිපත් කර ඇත.

''කණ්ඩුල නම් වූ මංගල හස්ථියා'' නැමැති ග්‍රන්ථයෙන් මංගල ඇතු සහභාගි වූ රාජකීය උත්සව අවස්ථාවන් ඇතුලු විශේෂ සිදුවීම් වර්ණවත් ඡායාරූප ආශ්‍රයෙන් පාඨක අවබෝධය පිණිස නිර්මාණය කර ඇති අතර ''මංගල හස්ථි'' කණ්ඩුල නම් වූ අනෙක් ග්‍රන්ථය හස්ථියා පිළිබඳව සවිස්තරව ග්‍රන්ථාරූඪ කොට ඇත.

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක විසින් ප්‍රධාන ආරාධිත අමුත්තා වූ ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් කලාභවන දොරටුව අභියසදි උනුසුම් අයුරින් පිළිගනු ලැබ අනතුරුව සම්ප්‍රදානුකූලව පොල් තෙල් පහන දැල්වීමෙන් අනතුරුව අප අතරින් වියෝ වූ වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කරමින් විනාඩි 2 ක නිශ්ශබ්දතාවයක් රකිමින් උත්සව අවස්ථාවේ වැඩ කටයුතු නිල වශයෙන් ආරම්භ කරන ලදි.

එහිදී ''කණ්ඩුල'' හස්ථියා පිළිබඳ ග්‍රන්ථ යුගලයෙහි පිටපත් පාබල හමුදා රෙජිමේන්තු අධිපතිතුමා විසින් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙත පිළිගන්වන ලදි.

ප්‍රවීන ජනමාධ්‍යවේදි, සම්භාවනීය නළු සහ කථිකාචාර්ය ජැක්සන් ඇන්තනි මහතා මෙහිදී ලාංකීය හස්ථි පරපුර පිළිබඳ විශේෂ දේශනයක්ද සිදු කළහ.

ගරු ආරක්ෂක ලේකම් සහ නාගරික සංවර්ධන ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් උත්සව අවසානයේ නික්ම යාමට ප්‍රථම උත්සව භූමියට රැගෙනවිත් සිටි කණ්ඩුල VII මඟුල් ඇතුට පළතුරු වලින් සංග්‍රහයක් පුද කිරීමට ද අමතක නොකළහ.




KANDULA
ANNIVERSARY






KANDULA
Sri Lanka Light Infantry







# 10 ශ්‍රීලපාහ සාමාජිකයින්ගේ ඒකමුතුවෙන් සංවර්ධන වැඩ කටයුතු රාශියක් නිමාවට

වත්මන් නියමුවානන් වන ලුතිතන් කර්නල් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහගේ නිවැරදි නායකත්වය හා මග පෙන්වීම යටතේ රටේ සංවර්ධන සංග්‍රාමයද විජයග්‍රහණය කිරීම සඳහා ඒකක දායකත්වය නොමදව ලබාදේ. සිවිල් ජන ජීවිතය යලි නගාසිටුවීම, මංමාවත් සැකසීම, රජයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය හා කෘෂි කර්මාන්තය යන විවිධ අංශ තුළින් සාර්ථකත්වය කරා ගමන් කිරීමට අදාල විවිධ සංවර්ධන ක්‍රියාදාමයන්ට අප බළඇණිය උරදී සිටි. තවද, ඒ සඳහා තම ධෛර්යය හා කැපවීම් සිදු කරන සෙබළුන්ගේ මානසික හා භෞතික සංවර්ධනයත් ඊට සමගාමීව පවත්වා ගෙන යාමද සිදු කරනු ලබයි. අණදෙන නිලධාරිගේ සංකල්පයකට අනුව දිර්ඝ කාලයක සිට සෙබළුන්ගේ සුබ සාධනය වෙනුවෙන් අඩුපාඩුවක්ව පවතින කාර්යයන් රාශියක් සිදු කරන ලදී. ඒ අනුව බළඇණි මුලස්ථාන කඳවුර තුළ නව බුදු මැදුරක් ඉදිකිරීම, ප්‍රධාන මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීම මෙන්ම පානිය ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ළිඳක් පිළිසකර කිරීම සිදු කරන ලදී.

හැදියාවෙන් හා සාරධර්ම වලින් ස්වයංපෝෂිත විනය ගරුක සෙබළෙකු බිහි කිරීම සඳහා ඔහු අදහන ආගමද බලපායි. මෙම ප්‍රදේශය තුළ ද්‍රවිඩ, මුස්ලිම් හා ක්‍රිස්තියානි වැනි ආගමික ස්ථාන ඉදි කර ඇතත්, ඒකකයේ බහුතරයක් බෞද්ධාගමිකයන්ය. ඔවුනට අවශ්‍ය වත්පිළිවෙත් ඉටුකිරීමට වර්තමානයේදී අපගේ 10 ශ්‍රීලපාහ බළඇණිය පාලිනගර්, මල්ලාවි ප්‍රදේශයේ ස්ථානගතව රාජකාරියේ නියැලි සිටි. මෙසේ නව භූමියක ස්ථාපනය කරනු ලැබූ අප ඒකකයේ අවශ්‍ය බුදු මැදුරක් කඳවුරු භූමිය තුළ ඉදි කිරීමට 2010.06.23 දින පෙරවරු 1035 පැයට යෙදි තිබූ සුබ මොහොතින් මුල්ගල තබා ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ බෝ අංකුරයක් රෝපණය කරන ලදී. ඉතාමත් කෙටි කාලයක් තුළ ඒකකයේ සියලුම දෙනාගේ පූර්ණ ශ්‍රම දායකත්වය හා කැපවීම මත ගල්, වැලි ගඩොල් වැනි දෑ ඒකකය තුළින්ම සපයා ගනිමින් ඉතාමත් අඩු පිරිවැයකින් මනරම් බුදු මැදුරක් ඉදි කිරීමට හැකිවිය. 2011.05.21 දිනට යෙදි තිබූ 2600 වන ශ්‍රී සම්බුද්ධ ජයන්ති බොදු තෙමඟුල දා සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනයක් පවත්වන ලදී. පසුදින දර්ශනිය පෙරහැරක් මගින් වැඩම කරවන ලද සමාධි බුද්ධ ප්‍රතිමාව පෙරවරු 1100 පැයට යෙදුනු සුබ මොහොතින් අණදෙන නිලධාරි විසින් බුදු කුටිය තුළ වැඩ හිඳුවා මියගිය හා අතුරුදහන් වූ නිලධාරි/සෙසුනිලයින් හට පිං අනුමෝදන් කරවමින් හා තුවාල ලැබූ අය හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් බුදු පිළිම වහන්සේ නිරාවරණය කිරීම අප කාගේත් සිත් පහන් කරවන අවස්ථාවක් විය.

සෙබළුන්ගේ ආහාර සකස්කරන ප්‍රධාන මුළුතැන්ගෙය වඩාත් ක්‍රමානුකූලව වැඩි ඉඩකඩ සහිත සනිපාරක්ෂක මුළුතැන්ගෙයක් බවට පත්කිරීමට අවශ්‍ය අලුත්වැඩියා කටයුතු ද සිදුකරන ලදී.

පානිය ජල අවශ්‍යතා සපුරා ගැනිම සඳහා කඳවුරු භූමිය තුළ ජරාවාසව පැවති ළිඳ ප්‍රතිසංස්කරණය කිරිමේ සුබසාධන කාර්යය ක්‍රියාවට නංවන ලදී. මෙම කාර්යයන් සඳහා ද අවශ්‍ය අමු ද්‍රව්‍යයන් සෙබළුන් විසින්ම සපයා ගනිමින් ඊට අවශ්‍ය පූර්ණ ශ්‍රම දායකත්වය ලබාදෙමින් ඉතාමත් කෙටි කාලයකින් වැඩ කටයුතු නිමා කර සෙබළ ප්‍රයෝජනයට යොදා ගැනිමට හැකිවිය.

බුද්ධි අංශය 10 ශ්‍රීලපාහ

# SPORTS

There are various kinds of sports in our country. Some of them are Cricket, Volleyball, Football, Netball, Rugger, Elle, Tennis, Badminton, Swimming and Hockey. Among them Cricket is the most popular sport in Sri Lanka but Volleyball is the National sport in Sri Lanka.

Sports also teach us good moral values. We can learn good qualities and good attitudes of persons.

A good sportsman can take both victory and defeat a like. He is very patient. He accepts any decision without gambling. He is well disciplined and well mannered.

The habit of playing games gives us a lot of benefits. It keeps our body healthy and strong. It also teaches us how to work with different types of people. Most importantly, Sports and games make our life going.

WA Nimsara Sewmini
K/Ariyawansha M:V
Grade 8
Daughter of 1 SLLI CPL Sudarshana WA

# එඩිතරයි ඇය තවම

තල් වැටේ මායිමේ
ගිනි අවිය අත දරන්
දැය සුරැකි විරුව ඔබ
ඉතිං ඇත සමු අරන්
ඔබේ හද මැදුරේ උන්
බිරිඳ අද තනිවෙලා
ඇගේ සිත වෙනදාට වඩා
ඇත එඩිතර වෙලා
ගත සවිය නොමැති වුව
කුරිරු වූ මිනිසුන්ව පරදන්න
සිත සවිය ඇත විරුව
එදා ඔබ ඇයට දුන්න
නොහැක කවදාවත්ම
විරු බිරිඳ පරදන්න
ලෝකයම ජය ගන්න
එඩිතරයි ඇය තවම

1997.06.06 දින අවසන් සුසුම් පොද රට දැය වෙනුවෙන් මුදාහල 6 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/13850 සැරයන් තිලකරත්න එම් ගේ සදාදරණිය බිරිඳ

කේ මාවඩවිලගේ

# 8 ශ්‍රීලපාහ පස්වන අණදෙන නිලධාරි



**ප්‍රෞ**ඪ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදාවේ අභිමානවත් ඒකකයක් වන 8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව පැවති යුදමය වාතාවරණය නිසා ඇතිවූ හටපිරිස් හිඟතාවය මත වර්ෂ 2000 ක්වූ ජූනි මස 16 වන දින 3 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව සමග ඒකාබද්ධ කරන ලදී. එසේ වුවද නව ඒකක නගා සිටුවීම යටතේ ස්වාධීන බළඇණියක් ලෙස නැවත 2004 මාර්තු මස 25 වන දින මෙම ඒකකය නැවත ස්ථාපිත කරන ලදී. ප්‍රතිස්ථාපනය කරන ලද මෙම ඒකකයේ අණදෙන නිලධාරිවරුන් හතර දෙනෙකු විසින් මේ දක්වා ඒකකයට අණදීම සිදු කර ඇත.

2011 නොවැම්බර් මස 22 වන දින නි/62588 මේජර් එස්ජ්යුජ් සෝලංගආරච්චි පීඑස්සී ශ්‍රීලපාහ අණදෙන නිලධාරි වශයෙන් පත්වූ අතර, ඒ වෙනුවෙන් 8 ශ්‍රීලපාහ බළඇණිය විසින් අභිනවයෙන් සම්ප්‍රාප්ත අණදෙන නිලධාරි වෙනුවෙන් කඳවුරු සම්මාන මුරයක් පිරිනමා පිළිගන්නා ලදී. ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් එළඹී සුබ මොහොතින් කිළිනොච්චි ලුම්බිණි විහාරස්ථානයේ නායක හිමිපානන් විසින් පවත්වනු ලැබූ සෙත් පිරිත් සජ්ඣායනාව මධ්‍යයේ අණදෙන නිලධාරි නව තනතුරේ වැඩ භාරගන්නා ලදී. ඉන්පසු කඳවුරු පරිශ්‍රයේ ඉදි කර ඇති බුදු මැදුර වෙත ගොස් ආගමික වතාවත් සිදු කර දෙවන අණදෙන නිලධාරි සමගින් සියලුම නිලධාරීන් හඳුනාගැනීම ද ඉන් අනතුරුව රෙජිමේන්තු සැරයන් මේජර් විසින් ඒකකයේ ජ්‍යෙෂ්ඨ කොනොනින් හඳුන්වාදීම ද සිදු කරන ලදී.



පසුව නව අණදෙන නිලධාරිතුමන් කෙටි දේශණයක් සිදු කරමින් පවසා සිටියේ 8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව නැවත නගා සිටුවීමෙන් පසු අණදුන් අණදෙන නිලධාරිවරුන්ගේ අධිෂ්ඨාන පූර්වක මඟ පෙන්වීම යටතේ ගෙවී ගිය වසර හතක කාලය තුළ ඒකකය ලබා ඇති ප්‍රගතිය සහ දියුණුව පිළිබඳව ප්‍රසංශාත්මව සිහිපත් කරන ලදී. එසේම තවත් බොහෝ දුර ගමනක් යා යුතුව ඇති අතර, එම ගමන් මඟෙහි නිතැනින්ම තිබිය හැකි බාධක, කරදර, දුක් කම්කටොළු, අභියෝග මෙන්ම සොම්නස සමබරව දරාගෙන ජයටැඹ කරා අභිමානයෙන් යුතුව පියවර තැබීමට අප සියළු දෙනා එක්ව කටයුතු කළ යුතු බවද සඳහන් කරන ලදී. ශ්‍රී ලංකාවාසීන් විසින් අත් විඳිනු ලබන නිදහස උදාකර දීම වස් තම ජීවිතය පරිත්‍යාග කරන ලද සහ තුවාල වූ සියළු අයවලුන්ද සිහිපත් කරන ලද අතර, දිනාගත් නිදහස ආරක්‍ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව ද අවධාරණය කරන ලදී.

එදින සවස නව අණදෙන නිලධාරි ගේ ප්‍රධානත්වයෙන් ඒකකයේ සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් කිළිනොච්චි ලුම්බිණි විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමින් වහන්සේ වැඩම කරවා විශේෂ බෝධි පූජා පිංකමක් සිදු කරන ලදී.



''අණදෙන නිලධාරි තුමණි'' 8 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ ප්‍රෞඪත්වය ඉතා උසස් ලෙස අභිමානයෙන් යුක්තව ඉහල නංවාලීමට ගෙවීයන සෑම තත්පරයකම ඔබතුමාගේ අණදීම යටතේ කටයුතු කිරීමට අප අදිටන් කර ගන්නා සේම එම මහගු කාර්යය විශ්වාසවන්තව ඉවසීමෙන් සහ කැපවීමෙන් කළ යුතු බැව්ද අප විසින් පසක් කරගෙන සිටින්නෙමු. ''**සේවය කරමි**'' යන උදාර සංකල්පය සිත් තුළ ධාරණය කර ගනිමින් දේශයේ ස්වෛරිභාවය, භෞමික අඛණ්ඩතාවය මෙන්ම ස්වාධිපත්‍ය ආරක්‍ෂා කිරීමේ පරම අභිලාශයෙන් යුතුව නව අණදෙන නිලධාරි තුමන්ගේ අණදීම යටතේ සේවය කරන්නට අප සෑම අදිටන් කරගෙන සිටිමු. ඔබ තුමාගේ ඉදිරි ගමනට ඇවැසි ශක්තිය ධෛර්යය හා ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය නොඅඩුව ලැබේවායි අප ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ**

# 65 සේමු 20 යි 20 ක්‍රිකට් තරඟාවලිය - 2011

65 සේනාංකයේ අනුග්‍රහයෙන් සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් සංවිධානය කළ අතර, ඒ සඳහා සේනාංකය යටතේ ඇති බලසේනා, පුහුණු පාසල් හා ඒකක වෙතින් කණ්ඩායම් 16 ක් ඉදිරිපත් වූහ. මෙම තරඟාවලිය 651 බලසේනාවේ අධීක්ෂණය යටතේ පැවැත්වූ අතර, තරඟාවලිය පලමු වටය පරාජිතයින් පිටුදැකීම යටතේ ද, දෙවන වටය ලීග් ක්‍රමය යටතේ ද තරඟ වැදී පසුව අර්ධ අවසන් වටය හා අවසාන වටය ලෙස තරඟ වැදුනි. මෙම කණ්ඩායම් 16 අතුරින් සැහැල්ලු ක්‍රිකට් තරඟාවලියේ විශිෂ්ටම කණ්ඩායම සොයා ගැනීම සඳහා 2011.12.26 වන දින මුලංකාවිල් මහජන ක්‍රිඩාංගනයේදී තරඟ ආරම්භ කළහ.

මූලික තරඟවලින් පසු අර්ධ අවසාන වටයේ තරඟ සඳහා 19 ශ්‍රීලපහ, 28 ශ්‍රීලපාහ, 21(සෙව්) ශ්‍රීලපාහ, 20 (සෙව්) විපාරෙ කණ්ඩායම් සුදුසුකම් ලැබූහ. එම ඒකක අතුරින් අවසන් වටය සඳහා 28 ශ්‍රීලපාහ හා 20 (සෙව්) විපාරෙ කණ්ඩායම් දක්ෂතා දක්වන ලදී.

අවසන් මහා තරඟය උත්කර්ෂවත් අන්දමින් 2012.02.22 දින මුලංකාවිල් ක්‍රිඩාංගනයේදී පැවැත්වූ අතර, ඒ සඳහා 65 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ආර්පී ද සිල්වා අයිජී, 651 බලසේනාධිපති කර්නල් සීඑම්ඩීපී චන්ද්‍රසේකර ඇතුලු සේමු යටතේ ඇති බලසේනාධිපති වරුන් ඒකක අණදෙන නිලධාරින් ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරින් රැසක් සහභාගී වූහ. අවසන් මහ තරඟයේදී 20(සෙව්) විපාරෙ කණ්ඩායම පරදා අති විශිෂ්ට අයුරින් 65 වන සේනාංක 20 යි 20 සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියේ කිරුළ හිමිකර ගැනීමට 28 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා කණ්ඩායම සමත් විය. මෙම තරඟාවලියේදී මුහුණ දුන් සියලු තරඟ ජයගත් එකම කණ්ඩායම ලෙසින් ද 28 ශ්‍රීලපාහ කණ්ඩායම පත්විය.

## ශූරයෝ 28 ශ්‍රීලපාහ

28 ශ්‍රීලපාහ කණ්ඩායමේ තරඟ කළ කණ්ඩායම් නායක සෙ/313756 සැරයන් සංජීව ඒඑස් තරඟාවලියේ දක්ෂතම පන්දු යවන්නා ලෙසද, සෙ/323283 සාසෙ ද සොයිසා ඒඒජීටී තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙසද, සෙ/329524 බංඩාර ඩබ්ලිව්එස් අවසන් තරඟයේ දක්ෂතම ක්‍රීඩකයා ලෙසද සම්මානයෙන් පිදුම් ලැබූහ.

මෙම ජයග්‍රහනය ලබාගැනීමට ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේඑල්එස්එස් ලියනගම ශ්‍රීලපාහ ගේ දැඩි කැපවීම හේතු වූ අතර, කණ්ඩායම තුළ සිටි සියලු ක්‍රීඩකයින් දක්ෂ ලෙස ක්‍රීඩාකර ජයග්‍රහණයට දායකත්වය ලබාදීම හා අනෙක් සියලු දෙනාගේ ද දිරි ගැන්වීම මෙම ජයග්‍රහණය හිමිකර ගැනීමට පිටුවහලක් විය.





# අභිමානවත් ලෙස 18 වන සංවත්සරය සැමරූ 10 ශ්‍රීලපාහ

මාදගල් ප්‍රදේශයේදී 1994.01.23 දින 10 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ස්ථාපිත කර එහි ප්‍රථම අණදෙන නිලධාරි වශයෙන් ලුතිතන් කර්නල් ඩබ්එම්ආර් විජේසුන්දර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රිලපාහ කටයුතු කරන ලදී.

මෙම ඒකකය මල්ලාවි පාලිනගර් ප්‍රදේශයේ ස්ථානගතව ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට අධාර උපකාර කරමින් ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කරමින් රාජකාරි කරමින් සිටියි. 2012.01.23 වන දිනට ඒකකයේ 18 වන සංවත්සරය යෙදි තිබුන අතර, ඉතාමත් චාම්ව හා අභිමානයෙන් යුතුව සැමරිමට දැනට ඒකකයේ වැඩ බලන අණදෙන නිලධාරි මේජර් ඒජීඑස් උදය කුමාර ආර්එස්පී ශ්‍රිලපාහ විසින් කටයුතු සිදු කරන ලදී.

ඒ අනුව ඒකකයේ හිටපු අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රිලපාහ ඇතුළු හටපිරිස් කණ්ඩායමක් ද ඒකකය සමඟින් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතින් 150 කට වැඩි පිරිසක් සමඟින් 2011.11.30 දින අනුරාධපුර රුවන්වැලිසෑය අභියස කප්රුක් පුජාවක් පවත්වමින් 18 වන සංවත්සරයේ උත්සව මාලාව ආරම්භ කළහ. පසුව 2011.12.20 දින ඒකකයේ නිලධාරි හා සෙනින්ගේ සහභාගිත්වයෙන් මහනුවර ශ්‍රී දළදා මාළිගාවේදී ශ්‍රී දළඳා වහන්සේ වෙනුවෙන් ගිලන්පස පුජාවක් පවත්වා මෙතෙක් ඒකකය සමගින් රාජකාරි කර මියගිය රණවිරුවන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් හා තුවාල ලබා ප්‍රථිකාර ලබමින් සිටින රණවිරුවන්ට නිරෝගි ඉක්මන් සුවය ද, සේවයේ යෙදි සිටින අයවලුන්ට සෙත් ප්‍රාර්ථනා කරන ලදී. ඒකක අණදෙන නිලධාරි ඇතුළු සියලුම නිලයින්ගේ සහභාගිත්වයෙන් ඒකකය ස්ථානගත වවුනිකුලම් මුලස්ථාන කඳවුරේදී 2012.01.19 දින මාන්කුලම් පන්සල වෙතින් වැඩම කරන ලද ස්වාමින්වහන්සේගේ ප්‍රධානත්වයෙන් බෝධිපුජාමය පිංකමක් පවත්වා ධර්ම දේශනයක් සිදු කරන ලද අතර, 2012.01.20 දින වව්නිකුළම් ප්‍රදේශයේ පිහිටි ශිවම් කෝවිලෙහිදී දේව පුජාවක්ද පවත්වන ලදී.

2012.01.23 දිනට යෙදී තිබු බළඇණි දිනය නිමිත්තෙන් උත්සව කටයුතු ආරම්භ කරමින් අණදෙන නිලධාරි විසින් බළඇණි ධජය ඔසවා බළඇණි දින පණිවුඩය කියවා ඒකකය සමගින් රාජකාරි කරනු ලබන සියලුම නිලයින් ඇමතිමක් සිදු කරන ලදී. පසුව ඒකකය සමගින් රාජකාරි කරනු ලබන සිවිල් සේවක මහතුන්ගේ සේවය ඇගයිම වස් ඔවුන්හට ත්‍යාගයක් ලබා දෙන ලදී. ඉන් අනතුරුව ඒකකයේ රාජකාරියේ නියතු අයවලුන්ගේ විනෝදාස්වාදය උදෙසා ආසේමු (කිලි) අනුයුක්තව රාජකාරි කළ සන්නාහ සන්නද්ධ බළකායේ අධි රිද්ම සංගිත කණ්ඩායමේ සහභාගිත්වයෙන් සංගිත සංදර්ශනය සමගින් සියළුම නිලයින් හට සාදයක් පවත්වන ලද අතර, අවසානයේ සියලුම නිලයින්ගේ සහභාගිත්වයෙන් දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.

10 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ස්ථාපනය කර වසර 18 ක් සපිරෙන මේ මොහොතේ විවිධ වු අපහසුතාවයන් මධ්‍යයේ යුද හමුදාවේ දීප්තිමත් බළඇණියක් වශයෙන් පෙරට ඒමට හැකිවුයේ ඒකකයට අණදීම් සිදු කළ සියලුම අණදෙන නිලධාරින්ගේ නිවැරදි මග පෙන්වීමත් ඒකකය සමගින් රාජකාරි කළ සියලුම නිලධාරි/සෙසුනිලයින්ගේ කැපවීමත් නිසාවෙන් බැව් මේ සුවිශේෂි අවස්ථාවේ සනිටුහන් කරනුයේ ඉතාමත් ගෞරවයෙනි.

**බුද්ධි අංශය 10 ශ්‍රීලපාහ**









# අභිනවයෙන් ඉදි කළ බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නය - 23 ශ්‍රීලපාහ




ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 23 වන සාමාජිකයා ලෙස 2009.07.23 වන දින එක්වී, ලුතිතන් කර්නල් ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රීලපාහගේ අණදීමෙන් 23 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව නමින් ස්ථාපනය කර වසර දෙකකට අධික කාලයක් මුලතිව් ප්‍රදේශයේ විවිධ ස්ථානයන්හි ස්ථාන ගත වී 2010.07.06 දින නන්දිකඩාල් කලපුවට මුහුනලා වඩ්ඩුවාකල් මුලතිව් ප්‍රදේශයේ ස්ථාන ගතවන ලදී.

පුරා වසර 30 කට අධික කාලයක් තිස්සේ පැවති කෲර ත්‍රස්තවාදි ක්‍රියාවන් නිම වීමෙන් පසු ඒකකය වෙත මුලතිව් ප්‍රදේශයේ සිවිල් ජන ජීවිතය නගා සිටුවීම සඳහා පැවරි ඇති නොයෙකුත් සිවිල් පරිපාලන කටයුතු සහ බළඇණියේ පාලන කටයුතු බොහොමයක් සිදු කරමින් පවති.

මෙවන් රාජකාරීන් බහුල අවස්ථාවක අප බලඇණිය තුළ විශාල අඩුපාඩුවක්ව පැවති බළලත් නිලධාරි හා සැරයන් නිවස්නයක් ඉදි කර ගැනීමට ඒකක අණදෙන නිලධාරිගේ මග පෙන්වීම යටතේ දෙවන අණදෙන නිලධාරි මේජර් ආර්එන්එස් ෆොන්සේකා ආර්එස්පී ශ්‍රීලපාහගේ පූර්ණ අධීක්ෂණය යටතේ ආරම්භ කරන ලදී.

රෙජිමේන්තු සැරයන් මේජර් බනි I ඩීජ්ඕපී ගුණවර්ධනගේ මනා සම්බන්ධීකරණයෙන් සහ කණ්ඩායම් නිලධාරි අණදෙනවරුන් සහ අනිකුත් සියලු නිලධාරින් ද ඒකකයේ සියලුම බළලත් නිලධාරින් ඇතුළු ජ්‍යෙකොනොනින්ගේ ද සහයෝගයෙන් හා සියලු සෙනීන් විසින් ලබාදුන් ශ්‍රම දායකත්වය හේතුවෙන් මාස 03 ක වැනි කෙටි කාලයක් තුළ අංග සම්පූර්ණ බළලත් නිලධාරි සැරයන් නිවස්නයක් වඩ්ඩුවාකල් ඉදිකර ගැනීමට හැකිවන ලදී.



රෙජිමේන්තුවේ මෙන්ම අප ඒකකයේ බළලත් නිලධාරි සහ ජ්‍යෙකොනොනින්ගේ එකමුතු භාවය විදහා දක්වමින් ඒකක අණදෙන නිලධාරිගේ ආරාධනයෙන් 591 බසේමු බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්කේජීඑන්බී ඇහැලමල්පේ ආර්එස්පී විසින් 2011.12.27 වන දින 0933 සුබ මොහොතින් නිවස්න භෝජනාගාරය විවෘත කළ අතර රෙජිමේන්තු සැරයන් මේජර් නිවස්නය අණ සහ පාලන කණ්ඩායමේ නිලධාරි අණදෙන මේජර් එස්එල් නන්දසේන ශ්‍රීලපාහ විසින් විවෘත කරන ලදී.

**වයිට් හැකල් අංශය 23 ශ්‍රීලපාහ**



## පෙම්වතකුගේ පැතුමක්

සුබ සිහිනයක් සැබෑවී
සුබ ප්‍රාර්ථනයක් සපලවී
ඔබේ ජීවිතයේ
සාමයේ සෞභාග්‍යයේ
පහන් දහසක්
දැල්වේවා......

**සාසෙ ප්‍රසන්න වයිජීඑන්**
**24 ශ්‍රීලපාහ**
**අණ සහ පාලන කණ්ඩායම**

## ලක්මව හිනැහේවි රණවිරු තුරුළේ ඉදන්

මොනයම් කුමන්ත්‍රණ කෙරුවත් නිවට වෙසින්
රණවිරුවන්ගේ සිත ගන්නට සතර දෙසින්
පෙර මග බලා ඉන්නේ බල ලෝබ සිතින්
ලක්මව හිනැහේවි රණවිරු තුරුළෙහි ඉදන්

ජාත්‍යන්තරෙන් ආවත් කොතරම් අවමාන
පැකිලෙනු එපා මව් කිරි බිව් රන් රුවන
සිංහල ජාතියේ නාමය සදා රැක ගන්න
පාබල විරුවනේ ඉදිරියටම තව තව යන්න

මව් තුරුළේ හිද රන් කිරි තොළ ගෑ නිබදේ
රණවිරුවෙකු ලෙසින් එඩිතර කම් පෑ සබෑදේ
ලොවම බිය වී ඇත තුන් හෙලයේ සද්දේ
ඉදිරියටම ගොස් පෙන්වමු මව්නි පාබල සද්දේ

**සාසෙ පුෂ්පකුමාර කේකේජ්එස් ආර්එස්පී**
**බුද්ධි අංශය 24 ශ්‍රිලපාහ**

## මුව දඩයම

අමල් සහ කමල් මුව දඩයමේ යන විට කැලේ තිබුණ වැවක මුවෙ-ක් වතුර බොමින් සිටිනු දුටුවේය. අමල් තුවක්කුවෙන් කුරුමානමක් ගත්තේය.

කමල් හෝ හෝ දැන්ම වෙඩි තියන්න එපා.
කමල් ඇයි! ඒ..
කමල් තුවක්කුවට පතුරොම් පුරවා නැහැ.
අමල් අපෝ ඒකට කමක් නැහැ පතුරොම් පුරවනකම් මුවා වතුර බිබී ඉන්න එකක් නැහැ

**සාසෙ ප්‍රසාද් කේඑච්එම්**
**බී කණ්ඩායම 24 ශ්‍රිලපාහ**

# 24 ශ්‍රීලපාහ පුවත්





## බුදු මැදුරක් ස්ථාපනය කිරීම

ලුතිතන් කර්නල් කේඑම්ඩබ්ලිව් බංඩාර ආර්එස්පී ශ්‍රීලපාහ 24 ශ්‍රීලපාහ වත්මන් නියමුවානන් ගේ සංකල්පයකට අනුව ඩී කණ්ඩායමේ නිලධාරි අණදෙන මේජර් එන්සී මාරසිංහ ශ්‍රීලපාහ ගේ හා සෙසුනිලයින්ගේ ධන/ශ්‍රම දායකත්වයෙන් වව්නියාව සෙට්ටිකුළම් ප්‍රදේශයේ රාජකාරී කරනු ලබන ඩී කණ්ඩායම් මුලස්ථානයේ ඉදි කරන ලද බුදු මැදුර 2012ක් වු දුරුතු පෝහොය දින යෙදී තිබූ සුබ මොහොතින් මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ ඒකක අණදෙන නිලධාරි විසින් විවෘත කරන ලදී. මෙම පුණ්‍ය කටයුත්ත සඳහා ඒකකයේ දෙවන අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලධාරි/සෙසුනිලයින් සහභාගි වූහ. එදින මහා සංඝරත්නය විසිනි සුමුදුර ධර්ම දේශනාවක් දේශනා කළහ.

## ☼ ක්‍රීඩා තරු



අන්තර් ඒකක මළල ක්‍රීඩා තරඟාවලිය - 2012 ජනවාරි මස 17 හා 18 දිනයන් හිදී දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩාංගණයේදී පැවති අතර, මෙම ඒකකය නියෝජනය කරනු ලැබු සෙ/327603 සාසෙ ලලිත් රණවීර කේඑම්එස් මීටර් 3000 බාධක දිවීමේ තරඟ ඉසව්ව සඳහා සහභාගි වී දෙවන ස්ථානය හිමිකර ගනිමින් රිදී පදක්කම ලබාගත් බව සාඩම්බරයෙන් යුතුව මෙසේ සනිටුහන් කර තබන්නෙමු.

## උදාරයි ඔබ නිවාස ව්‍යාපෘතිය





යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු පීඑස්සී මැතිතුමාගේ සංකල්පයකට අනුව ''උදාරයි ඔබ'' නිවාස ව්‍යාපෘතිය යටතේ 24 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේඑම්ඩබ්ලිව් බංඩාර ආර්එස්පී ශ්‍රීලපාහ ගේ අධීක්ෂණය යටතේ 24 ශ්‍රීලපාහ වෘත්තිය කුසලතා ඇති සෙබළුන්ගේ ශ්‍රම දායකත්වයෙන් සෙ/301835 බනි 11 ජයතිලක ඒඩී හට නව නිවසක් ඉදි කර දීමට කටයුතු සිදු කරන ලදී.

මෙම බළලත් නිලධාරි හට හිසට සෙවනක් ලබාදීම වෙනුවෙන් සිදු කළා වූ මෙම සත්කාරය ඒකකයට පමණක් නොව සියල්ලන්ට ආදර්ශයක් විය යුතු බැව් අප සැමගේ සිත් සතන් වල සනිටුහන් වී ඇත.

# නවතමයෙන් ඉදි කළ 23 ශ්‍රීලපාහ නිලධාරි නිවස්නය

රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ 23 වන සාමාජිකයා ලෙස වර්ෂ 2009 ක් වූ ජුලි මස 23 වන දින එක්වූ මෙම බළඇණිය ස්ථාපනය කර වසර 02 කට වැඩි කාලයක් ගත වුවත් එම කාලය තුළ ඒකකය විවිධ ස්ථානයන්හි ස්ථානගතවීම හේතුවෙන් ඒකකය වෙත නිලධාරි නිවස්නයක් ඉදි කිරීමට නොහැකි වීම මහත් අඩුපාඩුවක්ව පැවතුණි. එවන් අවස්ථාවක ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රීලපාහ ගේ මඟ පෙන්වීම යටතේ මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරි මේජර් ආර්එන්එස් ෆොන්සේකා ආර්එස්පී ශ්‍රීලපාහ ගේ සැලැස්මකට අනුව නව නිලධාරි නිවස්නය නන්දිකඩාල් කලපුව අසල ඉදි කිරීම ආරම්භ කරන ලදී.

ඒ අනුව නව නිලධාරි නිවස්නයේ ඉදි කිරීම් කටයුතු ආරම්භකර ඒකකයේ සියලු නිලධාරින්ගේ දායකත්වයෙන් සහ සියලු සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදි කරමින් පවතින අවස්ථාවේ මුලතිව් බළප්‍රදේශයේ නොයෙක් ඉදි කිරීම් කටයුතු සිදු කිරීම සදහා පැමිණ ඇති පුද්ගලික ආයතනයන්හි නෙත ගැටී ඔවුන්ගේද විවිධ දායකත්වයෙන් මෙම නිලධාරි නිවස්නයේ ඉදි කිරීම් කටයුතු කෙටි කාලයක් තුළ අවසන් කර ගැනිමට හැකි විය.

ඒ අනුව 23 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ නව නිලධාරි නිවස්නය 2011 වූ නොවැම්බර් මස 06 වන දින උදෑසන 0805 පැයට යෙදුන සුබ මොහොතින් 591 වන බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති බ්‍රිගේඩියර් එස්කේජීඑන්බී ඇහැළමල්පේ ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් හා මුලතිව් බළ ප්‍රදේශයේ ස්ථාපිත සියලු ඒකක අණදෙන නිලධාරිවරුන් හා සියලු නිලධාරින්ගේ සහභාගිත්වයෙන් විවෘත කෙරිණි.

බුද්ධි අංශය 23 ශ්‍රීලපාහ






# සිරි සමුද්‍රගිරි රජමහා විහාරයේ නව සංඝාවාසය සඟ සතු කළ වගයි

ශ්‍රී බුද්ධ වර්ෂ 2600 ක් වූ උදුවප් මස 13 වන දින මුලතිව් වඩ්ඩුවාකල් පිහිටි 23 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ පූර්ණ අධීක්ෂණය යටතේ ඉදි වෙමින් පවතින සිරි සමුද්‍රගිරි රජමහා විහාරයේ අභිනව සංඝවාසය විහාරාධිපති දිවයිනටම සාම විනිසුරු දේශකීර්ති ඇටඹගස්කඩ කළ්‍යාණතිස්ස නායක හිමියන්ගේ අනුශාසකත්වයෙන් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රීලපාහ ගේ ආරාධනයෙන් 591 වන බළසේනාධිපති බ්‍රිගේඩිර් එස්කේජීඑන්බී ඇහැලමල්පේ ආර්එස්පී විසින් සුබ මොහොතින් විවෘත කරණ ලදී.



දශක තුනකට අධික කාලයක් මුළුල්ලේ පැවැති කුරිරු ත්‍රස්තවාදයේ නිමාවත් සමඟින් එම නිමාවේ අවසන් බිම්කඩ වන නන්දිකඩාල් කලපුව මායිමේ පිහිටි මෙම සිරි සමුද්‍රගිරි රජමහා විහාරය මුලතිව් අවට ස්ථානගත හමුදා සාමාජිකයින්ගේ සිත් සතන් බැතිබර ප්‍රබෝධයකට ලක් කරන්නකි. මෙම රජමහා විහාරයේ ඉදිරි වැඩ කටයුතු සාර්ථකව නිම කර ගැනීම සඳහා සියලු දෙවියන්ගේ අශිර්වාදයත් ත්‍රිවිධ රත්නත්‍රයේ ආරක්ෂාවත් ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

වයිට් හැකල් අංශය 23 ශ්‍රිලපාහ





# 27 ශ්‍රිලපාහ ක්‍රීඩාගාරය විවෘත වූ වගයි...

27 ශ්‍රිලපාහ ඒකකයේ සියලු නිලයින්ගේ කාය වර්ධනය සඳහා දැඩි අඩුපාඩුවක්ව පැවති ක්‍රීඩාගාරය 2012 ජනවාරි මස 27 වන දින 1000 පැයට යෙදුනු සුබ මොහොතින් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී ශ්‍රිලපාහ සහ බළඇණියේ දෙවන අණදෙන නිලධාරි මේජර් අයිපී ජයසිංහ ශ්‍රිලපාහ යන නිලධාරින් විසින් විවෘත කළේ ඒකකයේ සියලුම නිලධාරින්ගේ හා සෙසුනිලයින් සතුටට පත් කරවමිණි. තවද ඒකකය ආරම්භ වී මෙතරම් කෙටි කාලයක් තුළදී මෙවැනි නවීන තාක්ෂණයෙන් යුත් කායවර්ධන යන්ත්‍ර ඇතුළත් ක්‍රීඩාගාරයක් බළඇණිය සතු වීමද අප ලැබූ ජයග්‍රහනයක් වේ. තවද මෙමගින් ඒකකයේ රාජකාරි කරනු ලබන සියලුම නිලධාරින්ට හා සෙසුනිලයින්ගේ කායවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ව්‍යයාම සිදුකර ගැනීමට හැකි වීම අප අගය කළ යුතුය.

බළඇණියේ දෙවන අණදෙන නිලධාරි සහ නිලධාරි අණදෙන අණ හා පාලන කණ්ඩායම වශයෙන් කටයුතු කරන මේජර් එච්ජ්ඩීවීකේ ඇලෙක්සැන්ඩර් ශ්‍රිලපාහ නිලධාරින්ගේ දැඩි අධීක්ෂණයෙන් යුතුව ඒකකයේ රාජකාරි නියුතු සියලුම නිලධාරින්ගේ හා සෙසුනිලයින්ගේ කැපවීමෙන් ඉදි කරන ලද මෙම කාය වර්ධන ක්‍රීඩාගාරය අප බළඇණියේ සියලු නිලයින් හට ඉමහත් ප්‍රයෝජනයක් වනවා නොඅනුමානය.

බුද්ධි අංශය 27 ශ්‍රිලපාහ







# අතීතයේ ප්‍රාර්ථනා බිඳක්

අන්ත දුක් ගැහැට විඳිමින් නිවහල් ජාතියක් බිහි කිරීමේ පරම පවිත්‍ර චේතනාවෙන් යුතුව ජීවිතයේ සුන්දරම කාල පරිච්ඡේදය දින සති මාස වලට පරිවර්ථනය කරමින් බිහිසුනු සංග්‍රාම භූමියේ සිට ඔබත් මමත් කළ මෙහෙය මිනිසෙකු විසින් තම ජාතියට හා උපන් බිමට කළාවූ සේවයකි. ජීවිතය තුළ පොදි බැඳගත් සුවහසක් ප්‍රාර්ථනා කෙරෙහි විශ්වාසයක් නොතබා ලක් මෑණියන්ගේ සෙවනේ වෙසෙන සියලු සතන් වෙනුවෙන් යුතුකම අවංකව ඉටු



කළ නිසාම අද අප සියල්ලන්ගේම දෙමාපිය නෑ හිත මිතුරන් බියෙන් සැකෙන් තොරව බුදුන් පුදන්නට යන්නෝය. නිදහසේ අකුරු කරන්නෝය. සාමෙන් ජීවත් වන්නෝය. සෙබළ ප්‍රෞඪ ඉතිහාසයක් හා අනාඩිමත් කාලයක හිමිකම් කියන ශ්‍රී ලාංකිකයින් කිසිවිටක නිවට බියගුලු වූයේ නැත. හෙළ විරුවන් එදා ජාතියේ නමින් එසවූ දහසක් සිංහ ධජ වෙනුවට ලක් දෙරණේ ශ්‍රී විභූතිය පතා හෙට දිනයේදී ද අපි දහසක් සිංහ ධජ ඔසවන්නෙමු.

සෙ/315918 සැරයන් ගයාන් ඕපීයූසී - 1 ශ්‍රිලපාහ

# ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් පෙරියමඩු කඳවුරට





26 ශ්‍රිලපාහ ඒකකය පෙරියමඩු ප්‍රදේශයේ ස්ථානගතවීමෙන් පසු එම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සුබසාධක කටයුතු බොහොමයක් ඉටු කරන ලද බැව් සඳහන් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි. ඒ හැර පසුගිය උඳුවප් පොහොය නිමිති කොටගෙන ඒකක අණදෙන නිලධාරි සහ සියලුම නිලධාරීන්ගේ පූර්ණ දායකත්වයෙන් සහ ධන පරිත්‍යාගයෙන් බෝධි ප්‍රකාරයක් කඳවුරු භූමිය තුළ නිමකරවා හෘද රෝග විශේෂඥ වෛද්‍ය මහාචාර්ය රවීන්ද්‍ර සතරසිංහ මහත්මාගේ





පූර්ණ දායකත්වයෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් ලබාගෙන කදවුරේ ස්ථාපිත නව බුදු මැදුර අභියස රෝපණය කිරීම සිදු කරන ලදී.

ශ්‍රී බුද්ධ වර්ෂ 2555 ක් වූ උඳුවප් මස පුර පසලොස්වක පොහොය දින හෙවත් ව්‍යවහාර වර්ෂ 2011.12.10 වන දින යෙදුනු සුබ මොහොතින් අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ජේඑල්ටීකේ හේවා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රිලපාහ විසින් ශ්‍රී මහා බෝධි අංකුරය ගරුතර මහ සංඝරත්නයේ සෙත් පිරිත් සජ්ඣායනාව මධ්‍යයේ බෝධි ප්‍රකාරයේ තැන්පත් කරන ලදී. අණදෙන නිලධාරිගේ ආරාධනයෙන් පැමිණි 61 වන සේනාංකාධිපතිතුමා විසින් සමරු ඵලකය නිරාවරණය කරන ලදී.

එදින දහවල් කාලයේ ගරුතර මහා සංඝරත්නය විසින් දිවා බුද්ධ පූජාව හා බෝධි පූජා පිංකමක් පවත්වා 61 වන සේනාංකාධිපති, 613 බළසේනාධිපති, ඒකක අණදෙන නිලධාරි හා අවට ඒකක අණදෙන නිලධාරිවරුන් ඇතුලු සියලුම නිලධාරි/සෙනින් ඉදිරියේ පෙරියමඩු ප්‍රදේශයට සහ පොදුවේ මුලු මහත් ශ්‍රී ලංකාවට සෙත් පතා පිරිත් දේශනාවක් පවත්වන ලදී. අනතුරුව 26 පාබල හමුදා සියලු නිලයන් විසින් මෙම උදාර පුණ්‍ය කටයුත්තට වැඩමවා සිටින සංඝයා වහන්සේලා විෂයෙහි සංඝගත දක්ෂිණාවක් ද පිරිනමන ලදී.

**බුද්ධි අංශය 26 ශ්‍රිලපාහ**

# 25 ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම්





25 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව 61 සේමු පාබල පුහුණු පාසලේදී 2011.10.04 දින සිට 2011.12.07 වන දින දක්වා බළඇණි පුහුණුවීම් වල නිරතවූ අතර, ඒ සඳහා නිලධාරින් 15 දෙනෙකු සහ සෙසුනිලයින් 454 දෙනෙකු සහභාගි විය. පාඨමාලාවේ දක්‍ෂතම කණ්ඩායම සම්මාන ලැබීමට ' බී ' කණ්ඩායමට හැකි විය. ඒ හැර පාඨමාලාවේ දක්‍ෂතම වෙඩික්කරුවා, දක්‍ෂතම පෙළ අණදෙන්නා. දක්‍ෂතම ශාරීරික යෝග්‍යතා සිසුවා, හොඳම බණ්ඩය සහ සමස්ත පාඨමාලාවේ දක්‍ෂතම සිසුවා තෝරා ගන්නා ලද අතර, ඔවුන්ට ද ඒ සඳහා වටිනා කුසලාන පිරිනමන ලදී. පාඨමාලා කාලය තුළ කණ්ඩායම් මට්ටමින් හා බළඇණිය මට්ටමින් විවිධ මාතෘකා යටතේ ඉතා උසස් තත්ත්වයේ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී. තවද පාඨමාලාව අවසානයේ නිලධාරි නිවස්නයේ සුහද හමුවක්, බනි/සැරයන් නිවස්නයේ සුහද හමුවක් හා සියලුම නිලයින් සඳහා සංගිත සංදර්ශණයක් පවත්වන ලදී.

මෙම බළඇණි පුහුණුවීම් තුළින් ඒකකයේ සිටින නිලධාරින්ගේ හා සියලුම සෙසුනිලයින්ගේ කුසලතා ඉතා උසස් තත්වයකට ගෙන ඒමට හැකිවූ අතර. මේ සඳහා ඒකකයේ වත්මන් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පි ගේ නායකත්වයත් 611 වන බළසේනාධිපති බ්‍රිගේඩියර් කේජීඩී පෙරේරා, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී අයිජී ගේ පූර්ණ අධීක්‍ෂණය හා 61 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒ කාරියකරවන, යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ මගපෙන්වීමත් නොමදව ලැබුණි. බළඇණි පුහුණුවීම තුළින් ලබාගන්නා ලද පන්නරය ඒකකයට පැවරෙන රාජකාරී වඩාත් කාර්යක්‍ෂමව හා ඵලදායිව ඉටුකිරීමට අත් වැලක් වනු නොඅනුමානය.








මූලස්ථානය 25 ශ්‍රීලපාහ

# 15 ශ්‍රීලපාහ 4 වන බළඇණි සංවත්සරය





ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 15 වන සාමාජිකයා ලෙස 2008 වර්ෂයේ ජනවාරි මස 03 වන දින ගමන් ආරම්භ කරන ලද අප බළඇණියේ සිව්වන සංවත්සර සැමරුම් උත්සවය ඒකකයේ වත්මන් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේටීපී ද සිල්වා ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ ප්‍රධානත්වයෙන් ආගමික කටයුතු වලට මුල්තැන දෙමින් ත්‍රිකුණාමලය තාවුල්වැව කඳවුරු භූමියේදී අති උත්කර්ෂවත් අන්දමින් පසුගිය ජනවාරි මස තුන්වන දින සමරන්නට යෙදුණි.

තුන්වන සංවත්සර උත්සවයෙන් ලද පන්නරය හා අත්දැකීම් පෙරටු කරගෙන 15 ශ්‍රීලපාහ බළඇණියේ නිලධාරි හා සෙසුනිලයින් විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු විධිමත්ව සංවිධානය කරන්ට යෙදුණි. මෙම කාලය වන විට අණදෙන නිලධාරි 221 බළසේනා මූලස්ථානයේ වැඩ බලන බළසේනාධිපති වශයෙන් බළඇණි මූලස්ථානය පිහිටි තාවුල්වැව කඳවුරෙන් බැහැරව රාජකාරි ඉටු කළද බළඇණි දින උත්සවය වෙනුවෙන් සංවිධානය කරනු ලබන සියලුම අංගයන් පිළිබඳව නිරන්තරයෙන් සොයා බලා උපදෙස් ලබා දෙමින් අධීක්ෂණය කර අවශ්‍ය කටයුතු නොඅඩුව සම්පාදනය කරදෙන ලදී.



පුණ්‍යමය කටයුතු වලට මුල් තැන දෙමින් මියගිය හා අතුරුදහන් වූ රණවිරුවන් උදෙසා පිං පමුණුවාලීමත් යුද්ධයේදී ආබාධිත තත්ත්වයට පත් සියලුම නිලධාරි/සෙසුනිලයින් හට නිදුක් නිරෝගි සුවය ප්‍රාර්ථනා කිරීමත් පෙරදැරි කරගෙන 2011 දෙසැම්බර් මස 31 වන දින රාත්‍රියේ සෙත් පිරිත් සජ්ඣායනාවක්ද පසු දින දහවල් සංඝගත දක්ෂිනාවක්ද පවත්වා සන්ධ්‍යා කාලයේ ත්‍රිකුණාමලය කෝනේෂ්වරම් කෝවිලේදී ඒකක ධජයට හා කණ්ඩායම් ධජවලට සෙත්පතා විශේෂ දේව පූජාවක් ද ඒකක සංවත්සර දිනය වෙනුවෙන් පැවැත් විය.

ආගමික වතාවත් වලින් පසු ඉතිරි වැඩ කටයුතු සඳහා හටපිරිස් යුහුසුලුව සූදානම් වූ අතර, ජනවාරි මස 03 වන දින අණදෙන නිලධාරි හට ආචාර සම්මාන මුරයක් හා නිලධාරින් 12ක් හා සෙසුනිලයින් 140ක් ගෙන් සමන්විත සම්මාන පෙළපාළියක් මඟින් උත්මාචාරය පුදකරලීමෙන් පසු සියලු නිල දිවා භෝජන සංග්‍රහයකට සහභාගි විය. ඉන් අනතුරුව පවත්වන ලද ක්‍රිඩා තරඟවල අවසන් මහා තරග සන්ධ්‍යා කාලයේ පවත්වන්නට යෙදුණි. මෙහිදි සියලුම කණ්ඩායම් අභිබවා 'ඩී' කණ්ඩායම සමස්ත ශුරතාවය හිමි කර ගන්නා ලදී.

ජනවාරි මස 04 වන දින පැවැත්වූ ලේ දන් දීමේ ව්‍යාපාරය සඳහා නිලධාරි/සෙසුනිලයින් 90 දෙනෙකු ලේ පරිත්‍යාග කිරීමට දායක වූහ.

ජනවාරි මස 06 දින රාත්‍රියේ සියලු හටපිරිස් වල රසාස්වාදය උදෙසා යුද හමුදා අධි රිද්ම සංගීත කණ්ඩායම සහ යුද හමුදා නර්ථන කණ්ඩායම්වල සහභාගිත්වයෙන් සංගීත රාත්‍රියක් පැවැත් වූ අතර, එහි සමාරම්භක අවස්ථාව සඳහා ත්‍රිකුණාමලයේ මහ දිසාපති මේජර් ජෙනරාල් ටීටීආර් ද සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී මැතිතුමන් ඇතුළු 22 වන සේනාංක මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහ ඒ යටතේ ස්ථාපිත බළසේනා මූලස්ථාන බළසේනාධිපතිවරුන් සහ අණදෙන නිලධාරිවරුන් සහභාගි විය. සංගීත රාත්‍රිය ආරම්භ කිරීමට මත්තෙන් ක්‍රීඩා තරගාවලියෙන් ජය ලැබූවන් හට ත්‍යාග හා කුසලාන ද සිවිල් සේවක මහතුන්ගේ සේවය අගයමින් ඔවුන් හට ත්‍යාග පිරිනැමීම පැමිණ සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරින් අතින් සිදු විය. ඉන් අනතුරුව ඒකකය වසර 4 ක් ආ ගමන්මග විදහා දැක්වෙන කෙටි වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කළහ. ඉන් පසු රැය පහන් වනතුරු යුද හමුදා සංගිත කණ්ඩායමේ නාද රටාවන්ට මුසුව ඒකකයේ සියලුම සෙබළුන් සිව් වසරක අභිමානය සමරනු ලැබූහ.

දැනට 22 වන සේනාංකයේ කීර්තිමත් බළඇණියක් ලෙස ඉහල විනයකින් හා මනා කැපවීමකින් යුතුව සියලුම නිලධාරින් සහ සෙසුනිලයින් රාජකාරින් ඉටුකරන නිසා මෙවර බළඇණි දින සංවත්සරය සාර්ථකව කරගැනිමට හැකිවූ අතර ඉදිරියේදි අප බළඇණිය පාබල මැණියන්ගේ විශිෂ්ට බළඇණියක් ලෙස සියලු අභියෝග ජයගනිමින් රාජකාරි ඉටු කිරීමට අණදෙන නිලධාරි ඇතුළු සියලුම නිලධාරින් හා සෙසුනිලයින් හට ත්‍රිවිධ රත්නයේ පිහිට හා ආශිර්වාදය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.






**බුද්ධි අංශය 15 ශ්‍රීලපාහ**

# ප්‍රජා මෙහෙවරක්



දශක තුනක් පුරා පැවති රුදුරු ත්‍රස්තවාදය නිමාවත් සමගම යුද හමුදාව රටේ සංවර්ධනයට ගෙන ඇති ක්‍රියා මාර්ග වලින් තවත් එක් උදාර මෙහෙවරක් වන යාපනය ආඥාපති තුමාගේ සංකල්පයක් මත 51 සේනාංකාධිපති තුමාගේ හා 513 බළසේනාධිපති තුමාගේ මග පෙන්වීම මත 11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි මේජර් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රිලපාහ ඇතුලු සියලුම නිලධාරි හා සෙසුනිලයින්ගේ පූර්ණ මෙහෙයවීම මත චංකානි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, කරෙයිනගර් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය හා සන්දිල්පායි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුනෙහි පාසල් 13 ක මෙවර අපොස (සාපෙළ) විභාහගයට පෙනි සිටින පාසැල් ළමුන් හයසිය දෙදෙනෙකු සඳහා ගණිතය හා විද්‍යාව විෂය ධාරා ආවරණය වන පරිදි සම්මන්ත්‍රණයක් 2011.11.26 වන දින දිනය පුරා යාපනය මධ්‍ය මහා විද්‍යාලය වඩුක්කුඩෙයි හි දි පවත්වන ලදී.

මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 51 සේනාංකයේ කර්නල් භකාස තනතුරේ රාජකාරී කරන ලුතිතන් කර්නල් මහේෂ් සොයිසා යන ජ්‍යෙෂ්ඨ නිලධාරි ඇතුලු අවට පාසල් හි විදුහල්පති වරුන් පැමිණෙන ලදී. මෙහිදි පැමිණ සිටින සියලුම අයවලුන් හට තේ පානයකින් ද, දහවල් ආහාරය හා සවස තේ පානයකින් ද, සංග්‍රහ කරන ලදී. එහි සියලුම සංවිධාන කටයුතු 11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් සිදු කරන ලදී. තවද එය සිවිල් ජනතාව හා යුද හමුදාව අතර සහයෝගය වර්ධනය කර අධ්‍යාපනය ලබන සිසු දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය තකා සිදු කරන ලද තවත් උදාර මෙහෙවරකි.

**11 ශ්‍රිලපාහ බුද්ධි අංශය**






## මගේ ලොවේ හිරු සඳු ඔබයි

ජීවන ගමනේ ඉරණම ලෙසින්
හමු වු ඔබ මගේ ලොවේ
ආදරණීය හිරු සදු ඔබයි කුමරුණි
ඔබේ පිවිතුරු ආදරය ලබන්නට
පෙරුම් පුරන්නට ඇති
සංසාරේ හැමදාමත් මම
උපදින හැම භවයකදීම
ඔබේ බිරිඳ වන්නට
පෙරුම් පුරන්නෙමි....
ඔබට සියලු දෙවි පිහිටයි..!

**සාසෙ විජේකොන් ඩබ්එම්එස්ජේ ගේ
ආදරණීය බිරිඳ දිපීකා (සුදු)**

## ANGUISH

Though we happen to live apart
Severed by a far cry,
The cherished memories of you
Live akin to my heart yearns
For sweet home and you,
Despite my vigil here
In the cruel battlefield.

**Jayaweera D Gunarathna
Father-in-Law of
Pte Perera BL - 4 SLLI**

## බලාපොරොත්තුව

පොලීසිය ඉදිරිපිට
තැපැල් හල ළඟ
නළ ළිඳ ළඟට වී
කොට්ටම්බා ගස් සෙවන යට
හිඳ බලා සිටින්නේ
පැමිණෙන තුරු ඔබ
රැගෙන යාමට අපව
සුරක්ෂිතව ආසේමු (මුලතිව්)
කඳවුරට ...
අප කාගෙත් නෙක පැතුම
''ලිබර්ටි" රථය ඔබ

**සාසෙ කිත්සිරි කේඑම්යු
ඒ කණ්ඩායම 12 ශ්‍රිලපාහ**




යුද හමුදා සේවා වනිතා ශාඛාව හා යුද පොදුසේවා බලකා රෙජිමේන්තුව එක්ව ප්‍රථම වතාවට සංවිධානය කරනු ලැබූ විරුදරු මලල ක්‍රීඩා තරඟාවලිය ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් 2011 නොවැම්බර් මස 10, 11 සහ 12 යන දිනයන්හිදි දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩාංගණයේදි පවත්වන ලදී.




මෙම තරඟාවලිය යුද හමුදාවේ සියලුම රෙජිමේන්තු/ ඒකකයන්හි සේවයේ නියුතු හා මියගිය රණවිරුවන්ගේ දුවා දරුවන්ගේ ක්‍රීඩා කෞෂල්‍යයන් ඉහල මට්ටමකට ගෙන ඒමටත් ඔවුන්ගේ සැඟවුණු දක්ෂතාවයන් ඉස්මතු කර ගැනිමට හා අන්‍යෝන්‍ය සහොදරත්වය වර්ධනය කිරීම උදෙසා පවත්වන ලදී.

ප්‍රථම වතාවට සංවිධානය කරනු ලැබූ මෙම තරඟාවලිය ඉතා උසස් මට්ටමකින් පැවති අතර, ඒ සදහා සියලුම රෙජිමේන්තු වෙතින් දුවා දරුවන් 1500 කට අධික ප්‍රමාණයක් තරඟවදින ලදී. අදාල තරඟාවලිය ඉලක්ක ගතකර අප රෙජිමේන්තු කණ්ඩායම තෝරා ගැනිම සඳහා ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ නිත්‍ය/සෙව් ඒකකයන් වෙතින් තරඟාවලියේ සියලුම තරඟ ආවරණය වන පරිදි නාමයෝජනා කැඳවූ අතර,





ඒ සදහා නාමයෝජනා 100 කට අධික ප්‍රමාණයකින් තරඟ කරුවන් තෝරා ගැනිම සඳහා මූලික තරඟාවලියක් රෙම ශ්‍රීලපාහ ක්‍රීඩාභාර නිලධාරි මේජර් පීජ්එම්එම් පෙරේරාගේ අධීක්ෂණය යටතේ අප රෙජිමේන්තු රසල් හයින් ක්‍රිඩා පිටියේදි හා කාලතුවක්කු හමුදා ක්‍රිඩාපිටියේදී රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් කේජේ ජයවීර ආර්එස්පීගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදීශ්‍රී එමගින් තෝරාගන්නා ලද අපගේ රණවිරුවන්ගේ දුවා දරුවන් 60 දෙනෙකු අදාල තරඟාවලිය සදහා ඉදිරිපත් කරන ලදී.






දින 03 ක් පුරා පැවති මෙම තරඟාවලියේ අපගේ දුවා දරුවන් දක්වන ලද දක්ෂතාවයන් නිසාවෙන් අනෙකුත් රෙජිමේන්තු වෙත අභියෝගයක් එල්ල කරමින් සමස්ත තරඟාවලියේ තෙවන ස්ථානය දිනා ගැනිමට අප රණවිරුවන්ගේ දුවාදරුවන් සමත් වියශ්‍රී ඇත්තෙන්ම එය අප රෙජිමේන්තුවට ආඩම්බරයක් මෙන්ම ගෞරවයකි.

තරඟාවලියේ සමාප්ති උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ජේ ජයසූරිය යුඑස්පී එන්ඩීයු පීඑස්සී හා යුද හමුදා සේවා වානීතා ශාඛාවේ ගරු සභාපතිණිය අනොමා ජයසූරිය මැතිනිය ද යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු පීඑස්සී ඇතුලු ජ්‍යෝෂ්ඨ නිලධාරින් විශාල ප්‍රමාණයක් හා සම්භාවනිය අමුත්තන් රැසක් ද සහභාගි වන ලදී.

ක්‍රිඩා අංශය රෙම ශ්‍රීලපාහ

# ශ්‍රීලපාහ අන්තර් ඒකක මලල ක්‍රීඩා තරඟාවලිය - 2012



ශ්‍රීලපාහ රෙජිමේන්තුව තුළ ක්‍රිඩා කටයුතු නංවාලිමේ අරමුණින් රෙජිමේන්තු අධිපති තුමාගේ සංකල්පයක් මත මෙවර ශ්‍රීලපාහ අන්තර් ඒකක මලල ක්‍රීඩා තරඟාවලිය 2012 ජනවාරි මස 17 සහ 18 යන දිනයන් හීදි ඉතා උත්කර්ෂවත් අන්දමින් දියගම මහින්ද රාජපක්‍ෂ ජාතික ක්‍රීඩාංගනයේදි පවත්වන ලදී.



උක්ත තරඟාවලියේ සත්කාරක ඒකකය වශයෙන් 11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව කටයුතු කල අතර, ඒ සදහා සංවිධාන දායකත්වය රෙජිමේන්තු ක්‍රීඩා අංශය වෙතින් ලබාදෙමින් මෙම තරඟාවලිය පවත්වන ලදී.

මෙම තරඟාවලිය සදහා නිත්‍ය/ස්වෙච්ඡා ශ්‍රීලපාහ හා රෙජිමුබ ශ්‍රිලපාහ යන ඒකකයන් නියෝජනය කරමින් ක්‍රීඩකයින් 1500 කට ආසන්න සංඛ්‍යාවක් තම ඒකකයන් වෙනුවෙන් උරෙන් උර ගැටෙමින් තියුණු ආකාරයෙන් තරඟ වැදුණි. එහිදි සියලුම මලල ක්‍රීඩා ඉසව් සඳහා ක්‍රීඩකයින් ඉදිරිපත් වී සිටීම සුවිශේෂි තත්ත්වයක් පෙන්නුම් කළ අතර, ආරම්භයේදී සමහර ඒකකයන් ලකුණු තත්ත්වයන් ඉදිරියට ගෙන යමින් තම ඒකකය පෙරමුණ කරා ගෙන ගියහ. එය තවත් විටෙක එම ඒකකයන් අභිබවා වෙනත් ඒකකයන් ඉදිරියට යමින් තරඟකාරි ස්වරූපය හා කැපවීම උද්යෝගය මනාව පෙන්නුම් කළහ.



මෙම මලල ක්‍රීඩා තරඟාවලියට සමගාමිව කඹ ඇදීමේ තරඟාවලියක් ද පැවැත්විණි. එම තරඟය ද උද්යෝගකාර වූ අතර, තියුණු තරඟයකින් අනතුරුව 8 ශ්‍රීලපාහ කණ්ඩායම 2012 අන්තර් ඒකක කඹ ශූරතාවය දිනාග න්නා ලදී.

තරඟාවලියේ සමාප්ති උත්සවය සදහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු පීඑස්සී තුමන් සහභාගි විය.

තරඟාවලියේ ක්‍රීඩක සෙනින් දැක්වූ දක්‍ෂතා නිසාවෙන්ම අනුශූරතාවය 6 වන බළඇණිය හිමිකර ගත් අතර, සමස්ත මලල ක්‍රිඩා තරඟාවලියේ ශූරතාවය 1 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් දිනාගන්නා ලදී. 2012 අන්තර් ඒකක මලල ක්‍රිඩා තරඟාවලියේ දක්‍ෂතම ක්‍රිඩකයාට හිමි කුසලානය 6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ සෙ/328437 සාසෙ බණ්ඩාර එස්ආර්එන්එස් විසින් දිනා ගන්නා ලදී.

රෙම ශ්‍රීලපාහ අන්තර් ඒකක මලල ක්‍රිඩා තරඟාවලියක් අවසන් වරට පවත්වන ලද්දේ 2003 වසරේදීය. මේ වන තෙක්ම තරඟාවලියන් පැවැත්වීමට නොහැකි වුවත් මෙවර පැවති ශ්‍රීලපාහ මලල ක්‍රීඩා තරඟාවලියේදි සියලුම ක්‍රීඩකයන්ගේ දැඩි උනන්දුව හා කැපවීම ඔවුන් තුළින් දක්නට ලද සුවිශේෂි ලක්‍ෂනයක් විය.





**රෙම ශ්‍රීලපාහ ක්‍රිඩා අංශය**





# 19 ශ්‍රීලපාහ බළඇණි පුහුණුව









දහ නවවන පාබල හමුදාවේ සියළුම දෙනාගේ දැනුම සාමුහිකත්වය වර්ධනය කිරීම සඳහා මුලංකාවිල් පුහුණු පාසැලේ පුරා දින 42 ක දක්ෂ උපදේශක මඩුල්ලක් යටතේ සාර්ථක බළඇණි පුහුණුවක් ලබන්නට අප සියළුම දෙනාට අවස්ථාව උදාවිය. ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජීඩීවයිආර් පෙරේරා ආර්එස්පී ශ්‍රීලපාහ විසින් පාඨමාව සඳහා පුහුණු පාසැල වෙත බළඇණිය පිටත්ව යාමට පෙර සුපරික්ෂාකාරීව සොයාබලා පුහුණුව සඳහා අවැසි සියලු කටයුතු සූදානම් කොට බළඇණිය පුහුණුව සඳහා ක්‍රමවත්ව සූදානම් කරන ලදී.

සැලසුම් කළ පරිදි පුහුණු පාඨමාලාව 2011.11.17 දින කිසිදු බාධාවකින් තොරව ආරම්භ කිරීමට හැකි විය. පුහුණු පාඨමාලා ආරම්භක දේශණය 653 වන බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් එස්කේ තිරුණාවුකරසු විසින් සිදු කරන ලදී. ඒකකයේ වෙතින් පිරිනැමූ සම්මාන මුරය පිළිගැනීමෙන් අනතුරුව දේශන ශාලාවට පැමිණි බළසේනාධිපති විසින් බළඇණි පුහුණුවේ ඇති වැදගත්කමත් එය සිදු කළ යුත්තේ කුමන ආකාරයෙන්ද යන්නත් පැහැදිලි කර දෙන ලදී.

පුහුණුවීම් ආරම්භයේ සිටම අණදෙන නිලධාරි පවසා සිටියේ අප මෙම ලද මහගු අවස්ථාවෙන් උපරිම ප්‍රථිඵල ලබාගත යුතුය යනුවෙනි. ඒ සඳහා සියලු දෙනාම උනන්දු විය. නිලධාරි අණදෙනවරුන් ඉතා උනන්දුවෙන් කටයුතු කර පුහුණුවීම් කටයුතු ඉතාමත් සාර්ථකව විනය ගරුකව ඉතා උසස් මට්ටමින් පවත්වාගෙන යාමටත් කටයුතු කළහ.

පුහුණු කාලසටහනට අනුව ශාරිරික යෝග්‍යතා, දේශණ, ප්‍රායෝගික පුහුණුවීම්, කොම්පාසු සංචාර, බාධක තරණය, අවි පුහුණුව, දරාගැනීමේ ශක්තිය, වේගවත් පා ගමන යන යන විශයයන්ට අමතරව පාඨමාලාවේ විශේෂ පුහුණුවක් ලෙස ජීව වෙඩි තැබීම් ද සිදු කළහ.

ජීව වෙඩි තැබීම් පුහුණුව බළඇණියේ සියලු දෙනාගේ ඉලක්කයට වෙඩි තැබීමේ හැකියාව තව දුරටත් ඔප මට්ටම් කරන ලද අතර, මේ සඳහා අණදෙන නිලධාරි විසින් විශේෂ අවධානයක් යොමුකර තිබිණි.

බුද්ධි අංශය 19 ශ්‍රීලපාහ

## යුද්ධය

මාවිල්ආරු සටනින් ඇරඹුණු යුද්දේ
තොප්පි ගලට ඊලග පිම්මට පැන්නේ
ඉදිරියට ගියා නිසිලෙස අප අණ මැද්දේ
නැගෙනහිරය පළමුව යුද ජය ගත්තේ

ලාකෝ අජිත් කුමාර පිඊඡ්
7 ශ්‍රිලපාහ, ඩී කණ්ඩායම

## අම්මා

පුතුන් සදාමවිබිම වෙනුවෙන් අම්මේ
වෙස්සන්තර රජු මෙන් දන්දුන් අම්මේ
මව් පදවියේ අරුන මට වැටහුණි අම්මේ
නොහඩන් මවිනි ඔබේ පුතු වෙමි මතු අම්මේ

ක්‍රෝපල් විජේරත්න ඩබ්එම්පිබි
7 ශ්‍රිලපාහ, ඩී කණ්ඩායම

## නුඹ

පාළු සිතට ගෙනෙන කඳුළ
නුඹේ දෝතින් පිසදාන්න
මගේ හදට ගෙනෙන සුසුම්
නුඹේ හදින් සනසවන්න
දිනක් ඇවිත් මගේ සකිසද
සාමයේ මල් පුබුදුවන්න
සතුට අරන් නුඹේ සිතට
මම එනවා නුඹ ළඟටම

ලාකෝ ඒකනායක එච්බීඑච්
7 ශ්‍රිලපාහ, ඩී කණ්ඩායම

## සමුගැන්ම

මිරිගුවක් පසුපස හඹා යන
මුව රැලක් මෙන්
දිවි කතරෙහි අතරමංව
දිව ආ අප හට
සිසිල් පැන් පොදක් වුණු
දයාබර විදු මාතාවගෙන්
සමුගන්න නිමේෂය එළඹිලා...
ඉතිං
දහතුන් වසරක සමුගැනීම
සමගින් දයාබර විදුමාතාවෙනි
පතන්නෙමු ඔබට
දීර්ඝායු වේවා...

සැරයන් ආරියරත්න,
ලාකෝ නන්දසේනගේ
නැගණිය කේඒඩී රේණුකා

## වස්සානයේ ආදරය

ඇද හැලෙන්නට තනන මහවැස්ස
පිළිගන්න කලුවෙලා බලා උන්
මේ තුළම සිත තල්ලු කොට දුරට
හිරුට පායන්න ඉඩ ලබාදී
දොර කවුළු විවරකොට
කෝපයෙන් සිතට හිරි වැටුණු
පොරෝණය විසිකොට බැන වදී
අසල කය කොට වදී අතට ගත්
ගෙඩිය දුන් ආදරය පිටු දකින්නේ
කොහොමද නුඹ විදින දුකට
ණය ගැති බැවින් නදි මතින්
යමි වැඩට

සාසෙ සුද්ධාහාමි එච්එම්
බී කණ්ඩායම 24 ශ්‍රිලපාහ

## සොබා දහම

විකසිත කර්ෂ වූ පොලෝ තලය
මත නිල්වන් දිය දහර නුඹයි
චන්ඩ රුදුරු වූ වන රොද මැද
නිසලව ගලන දිය දහර නුඹයි.
පිංබර කෙත් හරිතව ඔප කරන
දසුන මැව්වේ නුඹයි
අප ගැන සිතු සොඳුරු
සොබා දහම නුඹයි
සොහා දහමේ මේ වන රොද මැද
ගලායන ගඟක් මැද හෙලානා රුධිරය
දහඩිය මහන්සිය නොතකා
මව්බිම රැකුමට සවිබල දුන්නේ නුඹයි.

සාසෙ සුරේෂ්රත්න එච්එම්එන්
ඒ කණ්ඩායම - 19 ශ්‍රිලපාහ




සේ වය කරන්නට කැපවුනා මව් රටට
ව පුරන්න හැකි වුනා සාමය මව් බිමට
ය හ මග යන්න ජාතිය අප කළ පිනට
ක රදර බාධක ආවත් කොපමණ මෙමට
ර කිනෙමු දිවි පුදා මාගේ පුංචි රට
මි තුරනි එක්වන්න ගෙන යාමට රට පෙරට

සාසෙ කිත්සිරි කේඑම්යු
ඒ කණ්ඩායම - 12 ශ්‍රිලපාහ

## දිනෙක නුඹ

කැඩුණු මිරිවැඩිය ලෙන
මා වෙතට ඇවිදින් බලපන්
මා දිහා එකම එක ආදර
බැල්මක් දොඩපන් මා සමග
එකම එක ආදර වදනක්
නුඹේ එක බැල්මකින් නුඹේ
එක වදනකින් නිවේවා
මා හදේ පිරි නෙක
සෝ තැවුල්

සාසෙ කුමාරසිංහ එච්බීඒයු
බි කණ්ඩායම 24 ශ්‍රිලපාහ

## චැනල් 4

හොඳ ගති හොඳ සිරිත් ඇති අය අඩු නුන
ඉසුරු බර රටකි ඉතිහාසයෙන් පේන
ඒය වනසන ගොස් මියගිය කොටි රැන
චැනල් 4 තුලින් පෙන්වති හීන

චැනල් 4 තුලින් හාස්‍ය යොදා
ඊලම ගොඩ ගන්න වෙර දරණවා මෙදා
ලන්ඩන් රටේ පොදු ජනයා වෙනදා
බිය සැක හැර ත්‍රස්තවාදය තිබේ මුදා

සාසෙ රූපසිංහ ඩීබීඒඒආර්
බී කණ්ඩායම 24 ශ්‍රිලපාහ

## නොනිදන නෙතක පැතුම

මගේ සිත අද්දරින් පැයු
ඒ සඳ ඔබය
යාන්තමට පිපුණු පුංචි රෝස මලක
පෙත්තක අගට වැටුනු
පුංචි පිණි බිංදුවක් සේ
සුන්දරයි ඔබ
අහිංසක මගේ ලෝකයේ....
පහන් වැටක් සේ ඔබ අසන
හැම ගීතයේ අඳුර ඒ රුව නුඹයි...
අහිමි බව දැන දැනත් පෙම් කලේ
මා නුඹටමයි වෙන් වුන ඔබ
නැවතත් හමුවුනා මතකයි
ඒ සොඳුරු මොහොතේ
රැඳෙන්නට ඔබ ලග
හිදිම මම කල්පයක් වුනත්
ඔබ මතක සුවඳ තුරුළු කරන්
මතු භවයේදීවත් ලබන්නට
ඔබ සුරත හිදිම් මම දුර ඉදන්

සාසෙ රංජිත් කේඡ්ඩි
ඒ කණ්ඩායම - 19 ශ්‍රිලපාහ

# පුතුගේ අප්පච්චි

**බිදුණු හිත සනසන**
**මියැදුණු සිතට ජීවය දෙන**
**අදුරු දිවියට ආලෝකය වුනු**
**පුංචි පුතුනි මගේ...**
**එපා අහන්න අප්පච්චි**
**කොයිද කියා**
**මගෙ දෙනෙතට කඳුළු**
**පිරෙන නිසා**
**නිවාඩුවට ගෙදර ඇවිත්**
**පුංචි පුතු සුරතල් කර**
**පුතුගේ කිරි කැටි සිනා**
**රැල්ලක් මැද හිමිදිරි**
**පාන්දර පුතු දෝතට**
**ගෙන සිඹ තල් අරණට ගියේ...**
**පුතුනි නුඹට හිමි රට රකින්නටය...**
**සතුරු වෙඩි පහරින්**
**නුඹේ පියා මෙලොව හැර ගියත්**
**සැනසෙන්න පුතුනි ඔහු**
**වීර සෙබළෙකු නිසා...**

සාසෙ රොෂාන් කේඑම්
10 ශ්‍රිලපාහ






# දවසේ සිතුවිල්ල

බලාපොරොත්තු වු දේ ඔබට
නොලැබුනානම් එය ඔබට
අතවශ්‍ය වුවා වන්නට ඇත.
මනස සමනය කරගෙන සෑම
තත්ත්වයක් යටතේම
සහනයෙන් සිටින්න
යමක් කිරිමට පහසු
මගක් සෙවීම
අපහසු කාර්යයයි..

( පොත පත ඇසුරෙනි)

කෝප්‍රල් බුද්ධික කුමාර ඩීපී
22(සෙව්) ශ්‍රිලපාහ

# රට දැය අපේ

රටක් දැයක් වෙනුවෙන්
හෙටක් ඉතිරි කරනා
දේශප්‍රේමී සොයුරනේ.....
තල් වැටේ මායිමේ
ඔබේ පිය සමරු ළග
සමන් මල් මිටක් වී
වීර ඔබේ නාමයෙන්
පිපෙන්නම් සෙනෙහසින්....
සාමයේ මුදු සුවද
මුව පුරා තවරමින්
පිපුණු පොපි මලක් වී
සෙබලුනේ යුද බිමේ
හිදින්නම් ඔබ ළගින්.........
පතම් මුණි දෙපා වැද
නොරැදෙන්න මතු භවේ
ඔබේ සුරතේ ගිනි අවිය
හෙළ දිනු විරුවනේ.......

සැරයන් ආරියරත්න,
ලාකෝ නන්දසේනගේ
නැගණිය කේජ්ඩී රේණුකා



## දකිනතුරු

දහසක් පැතුම් පුරවාගෙන නුඹ හට පෙම්බැන්දා
ආදරයේ වටිනාකම නුඹ මට කියලා දුන්නා
සිහිනෙන් හැබැහින් ඔබෙ සිනහව වින්දා
ළඟදීම එනවා ලස්සන නුඹෙ ආදර කොල්ලා

ලාකෝ නාමල් ඩීඑස් ඩි කණ්ඩායම 19 ශ්‍රීලපාහ

# ශ්‍රීලපාහ අන්තර් ඒකක මලල ක්‍රීඩා ශූරතාවය 1 ශ්‍රීලපාහට

දශක තුනක පමණ කාලයක් රටේ පැවැති යුදමය වාතාවරණය නිමාකර සාමකාමි වූ නිවහල් වූ ශ්‍රී ලංකාව තුළ ක්‍රිඩා කේෂත්‍රය තුළින් පාබල හමුදාව තුළ මෙන්ම යුද හමුදාවටත් සමස්ත ශ්‍රී ලංකාවටත් කීර්තියක් ලබාදීම සඳහා ශ්‍රිලපාහ රෙජිමේන්තුව තුළ ක්‍රිඩා කුසලතාවයන් වැඩි දියණු කිරීමේ අරමුණින් රෙජිමේන්තු අධිපතිතුමාගේ සංකල්පයකට අනුව ක්‍රිඩාවන් දියුණු කිරීමේ අරමුණින් එක් එක් ක්‍රිඩාවන් සදහා ජ්‍යෙෂ්ඨ නිලධාරින් පත් කර ක්‍රිඩාවේ උන්නතියට වර්තමානයේ විවිධ පියවරයන් රාශියක් ගන්නා ලදී.

ඉන් තවත් එක් පියවරක් වශයෙන් මලල ක්‍රිඩා ක්ෂේත්‍රයේ ජව සම්පන්න දක්ෂයින් තෝරා ගැනිම සඳහා 2012 ජනවාරි මස 17,18 යන දිනයන් හි අන්තර් ඒකක මලල ක්‍රිඩා උත්සවයක් දියගම මහින්ද රාජපක්ෂ ක්‍රිඩාංගනයේදි පවත් වන ලදී. ශ්‍රීලපාහ ඒකක 27 ක් තුළින් දක්ෂ ක්‍රීඩකයින් අතුරින් ක්‍රීඩා ඉසව් 20 ක් සඳහා දක්ෂයින් තෝරා ගන්නා ලදී.



පැවති යුදමය හේතු නිසා ක්‍රිඩාව මොහොතකට පසෙකලා උතුරු නැගෙනහිර ඇතිවූ ත්‍රස්තවාදි ගැටුම් සඳහා තම ජව සම්පන්න ශක්තිය කැපකිරිමට සිදුවූ බැවින් වසර 30 කට අසන්න කාලයක් රට බේරා ගැනිමේ උදාරතර කාර්ය වෙනුවෙන් කාලය යෙදවූ අතර, එම කාලය නිමාවෙන් පසු නැවත ක්‍රිඩාව සඳහා රන් සීනු හඬ නාද කරන්නට සුදුසු පසුබිම් විවරව ඇත.

එවැනි පසු බිමක් තුල වර්ථමාන අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩබ්එස්කේ ලියනවඩුගේ ශ්‍රීලපාහ ගේ අධික්ෂණයෙන් මෙවර දියගම මහින්ද රාජපක්ෂ ක්‍රිඩාංගනයේ පැවති අන්තර් ඒකක මලළ ක්‍රිඩා උත්සවයේදි ක්‍රිඩාංගනය පුරා ඔල්වරසන් හඩ මධ්‍යයේ ඉපැරණි ක්‍රිඩකයින් සිහිකරමින් 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව සෙසු ශ්‍රීලපාහ ඒකක 26 ක් පරදවා ලකුණු 85 ක් ලබාගනිමින් 2012 ජනවාරි 18 වන දින සිට පැවති මලළ ක්‍රිඩා උළලේ ශූරතාවය රෙජිමේන්තු අධිපතිතුමන්ගේ සුරතින් ලබාගත් ගත්හ. එතුමන්ගේද උණුසුම් සුභපැතුම් ඒකකයට හිමිවන ලදී.

මෙම ජයග්‍රහනය ඒකකයේ සියලු නිලධාරි හා සෙසුනිලයින්ගේ අප්‍රතිහත ධෛර්යය සහ ඒකක හැගිමෙන් ලද ජයග්‍රහනයක් වන අතර, ඉදිරියේදි ඒකකය මෙන්ම රෙජිමේන්තුවටද සමස්ත යුද හමුදාවටද කිර්තියක් ලබා දිය හැකි ජයග්‍රහනයන් ලබා ගැනිමට ශක්තිය ධෛර්යය ලැබේවායි අපි සැවොම ප්‍රර්ථනා කරන්නෙමු.

බුද්ධි අංශය 1 ශ්‍රීලපාහ

# දසුනේ හසුන

හමුදා නිල ඇඳුම ඇඳ අවි අත දරණ
නොනිදා සටන් වැද නිසි ලෙස ජය ලබන
බිඳදා සතුරු බළමුලු නිදහස ගෙනෙන
සැමදා වාසනා සෙබළුන් රට රකින

ජාතිය පිළිබඳව හැඟුමන් ඇතිව ලයේ
කාලය ගෙවන සෙබළුනි නිදහසට දැයේ
භීතිය සැකය දුරුකර මතු ලබන පැයේ
නීතිය කරන්නට මං පෙත් තනමු දැයේ

සටන් බිමේ සමගිව පෙරමුනට යන
හොඳින් කන් යොමා හඬ දැන හැඳින ගෙන
නෙතින් බලා දැක සතුරන් කරන වින
හෙලන් බිම ඔවුන් අද ලක් බිම නසන

සැලකුම විනය ගරුකම නිසි හැසිරීම
සැලසුම අවංකව හොඳ සෙබළෙකු වීම
සැලසුම රටේ සාමය ඇති කරලීම
යුතුකම උපන් රට නිසි ලෙස සුරකීම



දසුන හා හසුන :- සෙ/315918 සැරයන් ගයාන් ඕපීයුසී - 1 ශ්‍රීලපාහ

## ප්‍රහේලිකා අංක 51

නිවැරදි විසඳුම්පත් 2012 ජුලි මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරඟ කූපනය සහ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

### වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 51

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 8 | 4 | 7 | 1 | 2 | 9 | 3 | 6 | 5 |
| 9 | | | | | | | | 1 |
| 3 | | 1 | 4 | 8 | 6 | 2 | | 7 |
| 5 | | 8 | | | | 6 | | 9 |
| 4 | | 6 | | 7 | | 5 | | 3 |
| 7 | | 3 | | | | 8 | | 2 |
| 2 | | 4 | 6 | 3 | 7 | 9 | | 8 |
| 1 | | | | | | | | 6 |
| 6 | 8 | 9 | 5 | 1 | 2 | 7 | 3 | 4 |

### ප්‍රහේලිකාව ගැන...

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.
2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.
3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.
4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.
5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.
6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

## වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 47

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 6 | 9 | 5 | 4 | 3 | 7 | 1 | 2 | 8 |
| 7 | 2 | 3 | 5 | 8 | 1 | 9 | 6 | 4 |
| 1 | 8 | 4 | 9 | 6 | 2 | 3 | 7 | 5 |
| 8 | 3 | 6 | 1 | 9 | 4 | 2 | 5 | 7 |
| 9 | 7 | 2 | 3 | 5 | 6 | 8 | 4 | 1 |
| 4 | 5 | 1 | 7 | 2 | 8 | 6 | 9 | 3 |
| 3 | 4 | 9 | 2 | 1 | 5 | 7 | 8 | 6 |
| 5 | 1 | 8 | 6 | 7 | 9 | 4 | 3 | 2 |
| 2 | 6 | 7 | 8 | 4 | 3 | 5 | 1 | 9 |

### තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්වය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගී දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 51 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රෙම ශ්‍රීලපාහ,
යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ,
හෝමාගම.

## මෙවර ජයග්‍රාහකයෝ

**ප්‍රථම ස්ථානය**

සෙ/301413 කෝප්‍රල් ඒකනායක ඊඑම්එස්බී
'පා' ශාකාව රෙම ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පනාගොඩ - හෝමාගම.

**දෙවන ස්ථානය**

සෙ/3324841 ලාකෝ රණසිංහ ඩීඩබ්ලිව්පීඩීඅයි
තුවාක අංශය රෙම ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පනාගොඩ - හෝමාගම.

**තුන්වන ස්ථානය**

සෙ/167808 ලාකෝ අසංක කුමාර කේටී
පසුමූලය 12 ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පනාගොඩ - හෝමාගම.

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**51**

### කූපනය

අංකය : ............................................................

නිලය : ............................................................

නම : ............................................................

රාජකාරී ලිපිනය : ............................................................

............................................................

............................................................

ඒකකය : ............................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ............................................................

# WAR HEROES MEMORIAL SRI LANKA LIGHT INFANTRY

අප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රාණදානයෙන් ඈපකැප වූ නිලධාරින් හා සෙබළුන් 3807 දෙනෙකු සදා අනුස්මරණය කිරීම සඳහා රෙජිමේන්තු අධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරින් ජ්‍යෙෂ්ඨ සේවා අත්දැකීම් ඇති විශ්‍රාමිකයින් හා සියළුම සෙබළුන්ගේ දිරිමත් කිරීම් හා ශ්‍රම ධන පරිත්‍යාගයෙන් යුතුව ඉදි වන රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් කටයුතු සිදු වන ආකාරය ඡායාරූපවලින් දක්වේ.














නොවැම්බර් මස 11 දින පළමු උපන් දිනය සැමරූ 1 ශ්‍රීලපාහ සෙ/315918 සැරයන් ගයාන් ඕජී ගේ ආදර පුතුණුවන් ගේෂාන් මතීෂ දෙනුවන්



නොවැම්බර් මස 03 වන දින පළමු උපන් දිනය සැමරූ 14(සේවි) ශ්‍රීලපාහ සෙ/14ඩී01045 ලාකෝ අලුත්වෙල ටීජීඑස්සී ගේ ආදරණීය දියණිය අයිඩී උද්යෝගිනි අලුත්වෙල






7 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/321803 ලාකෝ විජේකෝන් ඩබ්ලිව්එම්එස්කේ 2012.01.19 දින යූආර් සුනීතා දමයන්ති මෙනවිය සමඟ අතිනත ගන්නා ලදි.

# අන්තර් රෙජිමේන්තු කබඩි ශූරතාවය තෙවන වතාවටත් ශ්‍රීලපාහ හිමිකර ගත්වගයි.




1994 වසරේදී කබඩි ක්‍රීඩාව යුද හමුදාවට හඳුන්වා දීමෙන් පසු 2002, 2003, 2004, 2005, 2006 වසරයන්හි යුද හමුදා අන්තර් රෙජිමේන්තු කබඩි ශූරතාවය ශ්‍රීලයුපොදුසේබ කණ්ඩායම දිනාගෙන ඇති අතර, 2007, 2010 වසරයන්හී ශ්‍රීලපාහ රෙජිමේන්තු කබඩි කණ්ඩායම දිනාගෙන ඇත. 10 වන වරට කබඩි තරඟාවලිය යුද හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.



අන්තර් රෙජිමේන්තු කබඩි තරඟාවලිය 2011 නොවැම්බර් මස 08 වන දින සිට 12 වන දින දක්වා යුද හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

තරඟාවලිය සුපර් ලීග් සහ "ඒ" කාණ්ඩය වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ සංවිධානය කර තිබූ අතර, අප රෙජිමේන්තු කණ්ඩායම සුපර් ලීග් කොටසින් තරඟ වදින ලදී. ඒ සඳහා අප කණ්ඩායමට අමතරව, ශ්‍රීලංසසබ, ශ්‍රීලංසිරෙ, ගැහේබ, ශ්‍රීලයුපොහේබ, ශ්‍රීලයුපොදුසේබ යන රෙජිමේන්තු කණ්ඩායම් "ඒ" හා "බී" වශයෙන් කාණ්ඩ දෙකකට බෙදා ඔවුනොවුන් අතරේ ලීග් ක්‍රමයට තරඟ පවත්වන ලදී. ලබාගන්නා ජයග්‍රහණ හා ප්‍රතිවාදීන් හට ලබාදෙන්නා වූ ලකුණු හා ඔවුන්ට එරෙහිව ලබාගන්නා ලකුණු ප්‍රතිශතය අනුව අවසන් තරඟය සඳහා එක් කාණ්ඩයකින් කණ්ඩායම් දෙකක් ලෙසින් තෝරා ගැනීමට සංවිධායක කමිටුව කටයුතු යොදා තිබුණි.

ඒ අනුව ප්‍රථම තරඟය වශයෙන් 2010 වසරේදී ද කබඩි ශූරතාවය දිනාගත් අප රෙජිමේන්තු කණ්ඩායමත් ශ්‍රීලසිරෙ කණ්ඩායම සමඟ තරඟයෙන් ලකුණු 37/31 වශයෙන් අප කණ්ඩායම පරාජය වන ලදී. දෙවන තරඟය ගැහේබ කණ්ඩායම අපගේ ප්‍රතිවාදීන් වූ අතර එම තරඟය ලකුණු 33/20 වශයෙන් අප කණ්ඩායම ජය ගන්නා ලදී. ගැහේබ කණ්ඩායම හමුවේ සිංහ රෙජිමේන්තු කණ්ඩායම පරාජයට පත්වීම හේතුවෙන් අර්ධ අවසන් තරඟය සඳහා "ඒ" කාණ්ඩයෙන් අප කණ්ඩායමත් රෙම ශ්‍රීලංසිරෙ කණ්ඩායමත් සුදුසුකම් ලබාගත් අතර "බී" කාණ්ඩය යටතේ රෙම ශ්‍රීලංසසබ කණ්ඩායමත් රෙම ශ්‍රීලය්පොදුසේබ කණ්ඩායමත් සුදුසුකම් ලබාගත්හ.

ඒ අනුව ප්‍රථම අර්ධ අවසන් තරඟය ශ්‍රීලපාහ අප කණ්ඩායමත් රෙම ශ්‍රීලයුපොදුසේබ කණ්ඩායමත් සමග පැවති අතර එම තරඟය ලකුණු 19/15 වශයෙන් ජයගැනිමට අප ක්‍රීඩකයන් ලදී. දෙවන අර්ධ අවසන් තරඟයද රෙම ශ්‍රීලංසිරෙ කණ්ඩායම පරාජයට පත් කළ රෙම ශ්‍රීලංසසබ කණ්ඩායම අවසන් තරඟය සඳහා සුදුසුකම් ලබාගත්හ. ඒ අනුව අන්තර් රෙජිමේන්තු කබඩි තරඟාලියේ අවසන් මහ තරඟය 2011 නොවැම්බර් මස 16 වන දින සවස මහරගම ජාතික තරුණ සේවා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කර තිබුණි.

තරඟාවලිය ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් යුද්ධ හමුදාපති ලුතිනන් ජෙනරාල් ජේ ජයසූරිය වීඑස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගි වූ අතර, යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි මෙන්ම අප රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් ඒ සඳහා සහභාගි විය.

තරඟය නැරඹීම හා කණ්ඩායම් දෙක දිරිගැන්වීම සඳහා පැමිණි පිරිසෙන් ජාතික යොවුන් රගහල් ශාලාව පිරී ඉතිරී තිබුණි. තරඟ විනිසුරුවන්ගේ ආරම්භක සංඥාවන් සමග තරඟය ආරම්භ විය. මුල් භාගයේදීම තරඟය ප්‍රබල මුහුණුවරක් ගත් අතර කණ්ඩායම් දෙකම ප්‍රබල තත්වයක පසුවිය.

තරඟය නිමවන්නට විනාඩි 10 ක කාලයක් තිබියදී කණ්ඩායම් දෙකම සම ලකුණු තත්ත්වයක පසුවූ අතර අවසන් තත්පර 30 දී ආක්‍රමණික ක්‍රීඩකයාව පිටියෙන් ඉවතට විසිකරමින් ඉතාමත් ප්‍රවේගකාරී හා කණ්ඩායම් හැඟීමෙන් යුක්තව තමන්ගේ පලපුරුද්ද උපයෝගි කරගනිමින් තරඟය අප වෙත නතු කර ගනිමින් ජයග්‍රාහී ලකුණ හිමිකර ගැනීමට අප ක්‍රීඩයෝ සමත් වූහ. ඒ අනුව තෙවන වරටත් යුද හමුදා කබඩි ශූරයක් ලෙස කිරුළ පලඳින්නට ශ්‍රීලපාහ කබඩි කණ්ඩායමට හැකිවිය.

ඇත්තෙන්ම මෙම තරඟය අවසන් වන මොහොත දක්වා මෙම කුසලානය කුමන කණ්ඩායම දිනාගනිවි දැයි සියලු නරඹන්නන් හට කුතුහලයක් ලබාදුන් තරඟයක් විය. අවසන් මහා තරඟයක් තුළ දැකිය හැකි උපරිම ක්‍රීඩා විලාශය දෙපිලෙන්ම මේ තරඟයෙන් දිස්විය. තරඟාවලිය පුරාවටම දක්වන ලද දක්ෂතා නිසාම මෙවර තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා හට හිමි කුසලානය දිනාගැනිමට 14(සේව) ශ්‍රීලපාහ ඒකකයේ සෙ/14ඩී00940 කෝප්‍රල් සිරිවර්ධන ආර්ඩීජේ සමත්විය.

රෙම ශ්‍රීලපාහ ක්‍රීඩා අංශය

